සිංහල SINHALESE CINGHALAIS

# 2006 සංගණන ප්‍රශ්නාවලිය

## සහ එම ප්‍රශ්න ඇසීමට හේතු

Statistics Canada Statistique Canada

Canada

# හැඳින්වීම

කැනඩාවේ මීළඟ සංගණනය 2006 මැයි 16 වන දින පැවැත්වේ. වසර 300 කට අධික කාලයක් පුරා මෙම සංගණනය ජාතියක් හැටියට අප කවුරුන් ද යන වගත් අප ජීවත් වන ප්‍රජාව කෙබඳු ද යන වගත් විග්‍රහය කර ඇත. මැයි මස 16 වන දින රැස්කරනු ලබන සංගණන තොරතුරු අප සැමටම එකසේ වැදගත් වන අධ්‍යාපනය හා පුහුණුව, නව නිෂ්පාදන හා සේවාවන්, වැඩිහිටි නිවාස, සෞඛ්‍යාරක්ෂණ සේවා සහ අනෙකුත් බොහෝ වැඩ සටහන් සැලසුම් සංවර්ධනය කිරීම උදෙසා ප්‍රජා කණ්ඩායම්, ව්‍යාපාරිකයන් හා රජය විසින් ප්‍රයෝජනයට ගනු ඇත.

2006 සංගණනයෙන් ප්‍රථමවරට ස්වකීය ප්‍රශ්නාවලියට පිළිතුරු සැපයීම, අන්තර්ජාලය හරහා පරිගණකයෙන් හෝ පත්‍රිකාව මත හෝ සිදු කිරීමේ අවස්ථාව උදාකර දී ඇත.

## 1 වන කොටස

මෙම පොත්පිංචේ පළමු කොටසෙහි 2006 ජන සංගණනයේ දීර්ඝ ප්‍රශ්නාවලියේ අසා ඇති ප්‍රශ්න 53 ක් අන්තර්ගත වන අතර එම ප්‍රශ්නාවලිය ජනගහනයෙන් 20% ක් විසින් සම්පූර්ණ කරනු ලැබේ. කෙටි ප්‍රශ්නාවලියේ ප්‍රශ්න 8 ක් – ප්‍රථම ප්‍රශ්න හය සහ දීර්ඝ ප්‍රශ්නාවලියේ 16 හා 53 වන ප්‍රශ්න – ඇතුළත් වේ.

## 2 වන කොටස

කැනඩා සංඛ්‍යා ලේඛන ආයතනය මෙම ප්‍රශ්න විමසා ඇත්තේ මන්ද යන වග 2 වන කොටසේ අන්තර්ගත වන අතර එම ප්‍රශ්න මගින් සපුරාලන වැදගත් දත්තයන්හි අවශ්‍යතාවන් කුමක්ද යන්න පෙන්වා දේ.

2006 ජන සංගණනය සහ ඒට සමගාමී කෘෂිකර්මාන්ත සංගණනය පිළිබඳව යම් ගැටළුවක් ඇතොත්, කරුණාකර ඔබට ආසන්නතම කැනඩා සංඛ්‍යාලේඛන කාර්යාලයට දුරකථනයෙන් හෝ ලිපියක් මගින් අමතන්න. අදාළ ලිපිනයන් හා දුරකථන අංක පහතින් දක්වා ඇත.

# 1 වන කොටස

# 2006 සංගණිත ප්‍රශ්න

# 2006 සංගණන ප්‍රශ්න

අ. පියවර

සම්පූර්ණ කළ පසු රහසිගත වේ.

**2.** ඔබගේ දුරකථන අංකය සඳහන් කරන්න.

ප්‍රදේශය සංකේතය ____________ දුරකථන අංකය ________ ____________

**3.** ලිපිනය සඳහා ඉහත වෙන් කළ කොටසෙහි ලිපිනයක් මුද්‍රණය කර නොමැති නම් හෝ 2006 මැයි 16 වන දින ඔබ වෙනත් ලිපිනයක පදිංචිව සිටි නම් මෙම කොටස සම්පූර්ණ කරන්න.

අංකය සහ විදිය හෝ ලොට් අංකය සහ පැවරුම | නිවාස අංකය

______________________________ | ______________

නගරය, මහ නගර සභාව ,උපනගරය, ගම ,ඉන්දියානු රක්ෂිතය | පළාත / ප්‍රාන්තය

______________________________ | ______________

තැපැල් සංකේතය

________ ________

**1.** ආ පියවරෙහි ඇතුළත් කළ යුත්තේ කවුරුන් ද?

- මෙම ලිපිනයෙහි සාමාන්‍යයෙන් පදිංචිව සිටින අලුත උපන් බිළිඳන් සහ කාමර සගයන් ද ඇතුළුව සියලු තැනැත්තන් ;
- වර්ෂය තුළ තම දෙමාපියන් සමග විසීම සඳහා පැමිණෙන ශිෂ්‍යයන්, පාසල් යන අතරතුර හෝ ගිම්හාන රැකියාවක නිරතවී සිටින අතරතුර අන්කවර හෝ ස්ථානයක පදිංචිව සිටියද ඔවුන්ගේ දෙමාපිය ලිපිනයෙහි එම ශිෂ්‍යයන් ඇතුළත් කරනු ලැබිය යුතුය.
- බොහෝකොට මෙහි ජීවත් වන මාපිය දෙදෙනාගේම භාරයේ පසුවන ළමයින් මව හෝ පියා සමග සමාන කාලයක් ගත කරන ළමයින්, 2006 මැයි මස 16 වන දින ඔවුන් ජීවත්වන මවගේ හෝ පියාගේ නිවසෙහි ඇතුළත් කළ යුතුය.
- රැකියාව කරන හෝ අධ්‍යයන කටයුතු අතරතුර වෙනත් තැනෙක ජීවත්වන නමුත් කලින් කල මෙහි පැමිණෙන කලත්‍රයා හෝ පොදු නීතියෙන් (common-law) සහකරු/ සහකාරිය ;
- මෙම ලිපිනයෙහි සාමාන්‍යයෙන් වෙසෙන ස්ථිර පදිංචිය හිමි සංක්‍රාමණිකයන් ;
- සරණාගත තත්ත්වය ඉල්ලා සිටින තැනැත්තන් සහ ඔවුන් සමග මෙහි වෙසෙන පවුලේ සාමාජිකයන්;
- කාර්ය හෝ අධ්‍යයන අවසරපත්‍රයක් හිමි වෙනත් රටකින් පැමිණි තැනැත්තන් සහ ඔවුන් සමග මෙහි වෙසෙන පවුලේ සාමාජිකයන් ;
- සාමාන්‍යයෙන් මෙහි වෙසෙන එනමුත් දැනට ( වැඩිහිටි නිවාසයක්, රෝහලක් හෝ බන්ධනාගාරයක් වැනි) යම් ආයතනයක මාස හයකට නොඅඩු කාලයක පටන් වෙසෙන තැනැත්තන් ;
- අන්කවර හෝ තැනෙක නිවසක් නොමැති 2006 මැයි මස 16 වන දින මෙහි වෙසෙන තැනැත්තන්.

**2.** පහත දැක්වෙන තැනැත්තන් ආ පියවරෙහි ඇතුළත් නොකරන්න.

- කැනඩාව තුළ වෙනත් ලිපිනයක තම නිවස පිහිටා ඇති සහ මෙහි තාවකාලිකව නැවතී සිටින තැනැත්තන් (උදාහරණ : නෑහිතවතුන් හමුවීමට පැමිණෙන්නන් හෝ මෙහි මෙම ලිපිනයෙහි තම ද්විතීය වාසස්ථානය ඇති තැනැත්තන් );
- කැනඩාවට පැමිණ සිටින වෙනත් රටක පදිංචිකරුවන් (උදාහරණ : ව්‍යාපාරික කටයුතු සඳහා හෝ නිවාඩු ගත කිරීමට පැමිණෙන්නන්)
- වෙනත් රටක රජයේ නියෝජිතයන් සහ ඔවුන්ගේ පවුලේ සාමාජිකයන් .

**3.** ආ. පියවරෙහි ඇතුළත් කිරීමට කවරෙකු හෝ නොමැති නම් :-

○ 2006 මැයි 16 වන දින මෙම ලිපිනයෙහි වෙසෙන සියලු තැනැත්තන් කැනඩාව තුළ වෙනත් තැනෙක සාමාන්‍යයෙන් පදිංචිව සිටි නම් හෝ ආගන්තුකයන් හෝ වෙනත් රටක රජයේ නියෝජිතයන් වේ නම් මෙම රවුම තුළ ලකුණු කරන්න.

→ කරුණාකර ඔබගේ නම සහ සාමාන්‍ය දුරකථන අංකය පහත සඳහන් කරන්න. මෙම ප්‍රශ්නාවලිය සම්පූර්ණ නොකරන්න. එය මුද්දර ගාස්තු ගෙවා ඇති ලිපිකවරයේ බහා තැපැල් කරන්න.

→ පෙළපත් නාමය ______________________ නම ______________________

→ ප්‍රදේශ සංකේතය __________ දුරකථන අංකය __________ __________

ආ– පියවර

**1.** මෙහි මෙම ලිපිනයෙහි 2006 මැයි මස 16 වන දිනයේදී ඔබ ද ඇතුළුව පුද්ගලයන් කී දෙනෙක් සාමාන්‍යයෙන් වාසය කරත් ද? *මෙහි සාමාන්‍යයෙන් වෙසෙන සියලු තැනැත්තන් ඔවුන් තාවකාලිකව බැහැර ගොස් සිටියද මෙහි ඇතුළත් කරන්න.*

__________

**2.** මෙහි සාමාන්‍යයෙන් වෙසෙන ඔබ ද ඇතුළුව සියලුම තැනැත්තන්ගේ නම් පැහැදිලි අතුරින් මෙහි ලැයිස්තුගත කරන්න. *අදාළ වේ නම් වැඩිහිටියකුගේ නමින් ලැයිස්තුව ආරම්භකර ඔහුගේ/ ඇයගේ කලත්‍රයා හෝ පොදු නීතියෙන් සහකරු ඊට පසුව ද මෙහි සාමාන්‍යයෙන් වෙසෙන ඔවුන්ගේ ළමයින් ඊටත් පසුවද යෙදෙන සේ නම් ඇතුළත් කරන්න. මෙහි සාමාන්‍යයෙන් වෙසෙන අනෙකුත් සියලු තැනැත්තන් ද ඊට ඇතුළත් කරන්න.*

| | පෙළපත් නාමය | නම |
|---|---|---|
| 1 වන තැනැත්තා | | |
| 2 වන තැනැත්තා | | |
| 3 වන තැනැත්තා | | |
| 4 වන තැනැත්තා | | |
| 5 වන තැනැත්තා | | |
| 6 වන තැනැත්තා | | |
| 7 වන තැනැත්තා | | |
| 8 වන තැනැත්තා | | |
| 9 වන තැනැත්තා | | |
| 10 වන තැනැත්තා | | |

## ඇ – පියවර

ආ– පියවරෙහි ඇතුළත් කළයුතු දැයි යන සැකය මත ඔබ විසින් යම් තැනැත්තකු ආ– පියවරෙහි ඇතුළත් නොකරනු ලැබුවේද?

*උදාහරණ :*

- *වෙනත් නිවසක් හිමි එහෙත් මෙම ලිපිනයෙහි වෙසෙන තැනැත්තන්;*
- *තාවකාලිකව පැහැර ගොස් සිටින තැනැත්තකු .*

❍ නැත

❍ ඔව් ➔ නම, ඥාති සම්බන්ධය හා හේතු සඳහන් කරන්න.

නම(ම්) ______________________

______________________

ඥාති සම්බන්ධය/ ______________________

හේතු ______________________

---

## ඇ – පියවර

**1.** ඉහත ආ- පියවරෙහි ඇතුළත් කරන ලද යම් තැනැත්තකු අලෙවිය සඳහා යටත් පිරිසෙයින් එක් කෘෂි නිෂ්පාදනයක් හෝ නිපදවන ගොවිපල ක්‍රියාකරුවකු වන්නේ ද? (හෝග පශු සම්පත් , කිරි නිපදවීම්, කුකුළු පාලනය, බිත්තර, හරිතාගාර හෝ තවාන් නිෂ්පාදන, නත්තල් ගස්, තණපිඩැලි, පැණි, මීමැසි, මැපල් යුෂ නිෂ්පාදනය, ලොම් ආදී වෙනත් දෑ)

❍ නැත ➔ ඉ– පියවරට යන්න

❍ ඔව්

**2.** මෙම ගොවිපල ක්‍රියාකරු එම ගොවිපල සම්බන්ධයෙන් එදිනෙදා කළමනාකරණ තීරණ ගැනීම සිදු කරයි ද?

❍ නැත

❍ ඔව්

---

## ඉ– පියවර

4 වන පිටුවේ ඉහළින් වූ 1 වන ප්‍රශ්නය සඳහා ආ– පියවරෙහි ඇතුළත් කළ නම් සඳහන් කරන්න.
එම අනුපිළිවෙළටම එම නම් ඇතුළත් කරන්න.

---

**1.** නම

සපයා ඇති ඉඩෙහි, ආ- පියවරෙහි මෙන් එම අනු පිළිවෙලින් නම් පිටපත් කරන්න. පසුව ඒ එක් එක් තැනැත්තා සම්බන්ධයෙන් පහත සඳහන් ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

1 වන තැනැත්තා

පෙළපත් නාමය

________________________________________

නම

________________________________________

---

**2.** ස්ත්‍රී පුරුෂභාවය

- ❍ පුරුෂ
- ❍ ස්ත්‍රී

---

**3.** උපන් දිනය

| | දිනය | මාසය | අවුරුද්ද |
|---|---|---|---|
| *උදාහරණ :* | ***1 3*** | ***0 2*** | ***1 9 5 0*** |

*නිවැරදි දිනය නොදන්නේ නම් ආසන්නතම දිනය දක්වන්න.*

උපන් දිනය

| දිනය | මාසය | අවුරුද්ද |
|---|---|---|
| ______ | ______ | __________ |

---

**4.** විවාහක තත්ත්වය

*එක් රවුමක් පමණක් ලකුණු කරන්න.*

- ❍ කිසිදා නීතියෙන් විවාහ නොවූ (තනිකඩ)
- ❍ නීතියෙන් විවාහක (වෙන්නොවූ)
- ❍ වෙන්වූ නමුත් තවමත් නීතියෙන් විවාහක
- ❍ දික්කසාද
- ❍ වැන්දඹු

---

**5.** මෙම තැනැත්තා පොදු නීතියෙන් **(common-law)** පිළිගත් සහකරුවකු සමග ජීවත් වන්නේද?

*විරුද්ධ ලිංගිකයකු සමග හෝ සම ලිංගිකයකු සමග යුවලක් වශයෙන් එක්ව ජීවත්වන එහෙත් නීතියෙන් විවාහ නොවූ පුද්ගලයන් දෙදෙනෙකු ලෙස පොදු නීතියේ (common-law) දැක්වේ :*

- ❍ ඔව්
- ❍ නැත

---

**6.** 1 වන තැනැත්තාට ඇති ඥාති සම්බන්ධය.

මෙහි සාමාන්‍යයෙන් වාසය කරන එක් එක් තැනැත්තකු සම්බන්ධයෙන් 1 වන තැනැත්තාට ඔහුගේ/ ඇයගේ ඇති ඥාතිත්වය විස්තර කරන්න.

*එක් පිළිතුරක් පමණක් ලකුණු කරන්න නැතහොත් දක්වන්න.*

*සුළු දරුවන්, දරුකමට හදාගත් දරුවන් සහ පොදු නීතියෙන් පිළිගත් සහකරුවකුගේ දරුවන්, දූපුතුන් වශයෙන් සැලකිය යුතුය.*

*පහත පිළිතුරු එකක් හෝ අදාළ නොවේ නම් මෙම පුද්ගලයාගේ 1 වන පුද්ගලයාට ඇති ඥාති සම්බන්ධය දැක්වීමට වෙනත් කොටුව භාවිත කරන්න.*

*1 වන තැනැත්තාට ඇති 'වෙනත් ' ඥාති සම්බන්ධතා සඳහා උදාහරණ :*

- *මස්සිනා*
- *ලේලි හෝ බෑණා*
- *නවාතැන්කරුගේ බිරිඳ හෝ සැමියා*
- *කාමර සගයාගේ දුව හෝ පුතා*
- *සේවකයා*
- *සම ලිංගික විවාහක කලත්‍රයා*

1 වන තැනැත්තා

- ❍ 1 වන තැනැත්තා

2 වන තැනැත්තා

- ❍ 1 වන තැනැත්තාගේ සැමියා හෝ බිරිඳ
- ❍ 1 වන තැනැත්තාගේ විරුද්ධ ලිංගික පොදු නීතියෙහි පිළිගත් සහකරු/කාරිය
- ❍ 1 වන තැනැත්තාගේ සම ලිංගික පොදු නීතියෙහි පිළිගත් සහකරු/ කාරිය
- ❍ 1 වන තැනැත්තාගේ දුව හෝ පුතා
- ❍ 1 වන තැනැත්තාගේ බෑණා හෝ ලේලිය
- ❍ 1 වන තැනැත්තාගේ පුතාගේ හෝ දුවගේ දරුවා
- ❍ 1 වන තැනැත්තාගේ මව හෝ පියා
- ❍ 1 වන තැනැත්තාගේ මාමණ්ඩිය හෝ නැන්දම්මා
- ❍ 1 වන තැනැත්තාගේ සීයා හෝ ආච්චි
- ❍ 1 වන තැනැත්තාගේ සහෝදරයා හෝ සහෝදරිය
- ❍ 1 වන තැනැත්තාගේ මස්සිනා හෝ නැනණ්ඩිය
- ❍ නවාතැන්කරුවා හෝ නේවාසිකයා
- ❍ කාමර සගයා

වෙනත් - *සඳහන් කරන්න*

________________________________________

________________________________________

## දෛනික ජීවිතයේ කටයුතු

**7.** මෙම තැනැත්තා සතුව යම් කන් ඇසීමේ, පෙනීමේ, කථා කිරීමේ, ඇවිදීමේ, පඩිපෙළ නැගීමේ, නැමීමේ, ඉගෙනීමේ හෝ ඊට සමාන ක්‍රියාකාරකම් ඉටුකිරීමේ අපහසුතාවක් තිබේද?

❍ ඔව් - සමහර විටෙක
❍ ඔව් - නිරන්තරයෙන්
❍ නැත

---

**8.** යම් ශාරීරික තත්ත්වයක් හෝ මානසික තත්ත්වයක් හෝ සෞඛ්‍ය ගැටළුවක් හෝ මගින් මෙම තැනැත්තාට ඉටු කළහැකි කටයුතු ප්‍රමාණයෙහි හෝ කටයුතු වර්ගයෙහි යම් අඩුවීමක් සිදුකරනු ලැබ ඇත්ද ?

(අ) නිවසේදී?

❍ ඔව් - සමහර විටෙක
❍ ඔව් - නිරන්තරයෙන්
❍ නැත

(ආ) වැඩ කරන ස්ථානයේදී හෝ පාසලේ දී ?

❍ ඔව් - සමහර විටෙක
❍ ඔව් - නිරන්තරයෙන්
❍ නැත
❍ අදාළ නොවේ.

(ඇ) අනෙකුත් කටයුතු වලදී උදාහරණ වශයෙන් ගමන් බිමන් යෑමේ හෝ විවේක සුවයෙන් ගත කිරීමේදී ?

❍ ඔබ් - සමහරවිටෙක
❍ ඔව් - නිරන්තරයෙන්
❍ නැත

---

## සමාජ සංස්කෘතිකමය තොරතුරු

**9.** මෙම තැනැත්තා උපත ලැබුවේ කොහිද ?
*වර්තමාන සීමා නිර්ණයන්ට අනුව එක් පිළිතුරක් පමණක් සඳහන් කරන්න.*

කැනඩාවේ උපන්

❍ නිව්ෆවුන්ලැන්ඩ්/ලැබ්‍රඩොර්
❍ ප්‍රින්ස් එඩ්වර්ඩ් අයිලන්ඩ්.
❍ නෝවා ස්කෝෂා
❍ නිව් බ්‍රන්ස්වික්
❍ ක්විබෙක්
❍ ඔන්ටාරියෝ
❍ මැනිටෝබා
❍ සස්කැෂවාන්
❍ ඇල්බර්ටා
❍ බ්‍රිටිෂ් කොලොම්බියා
❍ යුකෝන්
❍ නෝත් වෙස්ට් ටෙරිටොරීස්
❍ නූනාවට්

කැනඩාවෙන් බැහැර උපන්

*රට සඳහන් කරන්න.*

______________________________

---

**10.** මෙම තැනැත්තා කුමන රටක පුරවැසියෙක්ද?

*අදාළ නම් පුරවැසිකම් එකකට වඩා ඇත්නම් සඳහන් කරන්න.*

*"ලියාපදිංචියෙන් කැනේඩියානු පුරවැසිභාවය " යනුවෙන් යම් සංග්‍රමණිකයකුට කැනේඩියානු පුරවැසිභාවය පිරිනැමීමේ ක්‍රියාවලිය වශයෙන් පුරවැසි පනත යටතේ සඳහන් කර ඇත.*

- ❍ උප්පත්තියෙන් කැනේඩියානු
- ❍ ලියාපදිංචියෙන් කැනේඩියානු

වෙනත් රටක — *සඳහන් කරන්න.*

______________________________

---

**11.** මෙම තැනැත්තා දැනට හෝ මින් පෙර කිසි කලෙක ස්ථිර පදිංචිකරුවකුව සිට අඅත් ද?

*"ස්ථිර පදිංචිකරු " යනු ආගමන බල අධිකාරින් විසින් කැනඩාව තුළ ස්ථිරව පදිංචිව සිටීමට අයිතිවාසිකම ප්‍රදානය කරන ලද තැනැත්තෙක් වේ.*

- ❍ නැත ➔ **13** වන ප්‍රශ්නයට යොමුවන්න.
- ❍ ඔව්

---

**12.** මෙම තැනැත්තා ප්‍රථමයෙන් ස්ථිර පදිංචිකරුවකු වූයේ කුමන වර්ෂයේද ?

වර්ෂය ______________

*නිවැරදි වර්ෂය නොදන්නේ නම් ආසන්නම වර්ෂය සඳහන් කරන්න.*

---

**13.** මෙම තැනැත්තාට යම් සංවාදයක් පැවැත්විය හැකි තරමට ඉංග්‍රීසි හෝ ප්‍රංශ භාෂාව කථා කළ හැකිද?
*එක් රවුමක් පමණක් ලකුණු කරන්න.*

- ❍ ඉංග්‍රීසි භාෂාව පමණි
- ❍ ප්‍රංශ භාෂාව පමණි
- ❍ ඉංග්‍රීසි හා ප්‍රංශ භාෂා දෙකම
- ❍ ඉංග්‍රීසි හෝ ප්‍රංශ භාෂා දෙකම කථා කළ නොහැක.

---

**14.** මෙම තැනැත්තාට සංවාදයක් පැවැත්විය හැකි තරමට ඉංග්‍රීසි හෝ ප්‍රංශ භාෂාව හැර කථා කළ හැකි අනෙකුත් භාෂා(ව)

- ❍ එකක්වත් නැත

හෝ

*අනෙකුත් භාෂා(ව) සඳහන් කරන්න.*

________________________________________

________________________________________

---

**15.** (අ) මෙම තැනැත්තා නිවසේදී බහුලව කථා කරන භාෂාව කුමක්ද ?

- ❍ ඉංග්‍රීසි
- ❍ ප්‍රංශ

*වෙනත් – සඳහන් කරන්න.*

______________________________

(ආ) මෙම තැනැත්තා නිවසේදී නිරන්තරයෙන් වෙනත් භාෂාවන් කථා කරයි ද?

- ❍ නැත
- ❍ ඔව්, ඉංග්‍රීසි
- ❍ ඔව්, ප්‍රංශ

*වෙනත් — සඳහන් කරන්න.*

______________________________

---

**16.** මෙම තැනැත්තා තම ළමාවියේ නිවසේදී මුලින් ඉගෙන ගත් සහ තවමත් වටහාගත හැකි භාෂාව කුමක් ද?

*උගත් මුල් භාෂාව තවදුරටත් මේ තැනැත්තාට වටහාගත නොහැකි නම් උගත් දෙවන බස සඳහන් කරන්න.*

- ❍ ඉංග්‍රීසි
- ❍ ප්‍රංශ

*වෙනත් — සඳහන් කරන්න.*

______________________________

---

*කැනඩාවේ බහුවිධ ජනගහනයේ සංයුතිය ග්‍රහනය කර ගැනීම උදෙසා වසර 100 කට අධික කාලයක් පුරා ජනගහනයේ මුතුන්මිත්තන්ගෙන් පැවත එන සම්භවය පිළිබඳ තොරතුරු මෙම සංගණනය මගින් රැස් කරනු ලැබ ඇත.*

**17.** මෙම තැනැත්තාගේ මුතුන්මිත්තන්ගේ ජනවාර්ගික හෝ සංස්කෘතික සම්භවයන් මොනවාද?

*සාමාන්‍යයෙන් මුතුන්මිත්තන් සීයා ආච්චිට වඩා වැඩි දුරස්ථ බවත් දක්වයි.*

*උදාහරණ – කැනේඩියානු, ඉංග්‍රීසි, ප්‍රංශ, චීන, ඉතාලි, ජර්මානු, ස්කොට්ලන්ත, නැගෙනහිර ඉන්දියානු, අයිරිෂ්, ක්‍රී, මික්මැක්, එක්සිමෝ, යුක්රේන්, ලන්දේසි, පිලිපීන, පෝලන්ත, පෘතුගීසි, යුදෙව්, ග්‍රීක, ජැමෙයිකානු වියට්නාම්, ලෙබනන්, චිලී, සැල්වර්දෝර්, සෝමාලි ආදිය.*

*අදාළ වන සම්භවයන් හැකි තරම්, පැහැදිලි අකුරෙන් සඳහන් කරන්න.*

______________________________

______________________________

______________________________

______________________________

---

**18.** මෙම තැනැත්තා ආදිවාසියකු එනම් උතුරු ඇමරිකානු ඉන්දියාන මෙටිස් හෝ ඉනුසිට් (එස්කිමෝ) ජාතිකයක් වන්නේ ද?

*"ඔව් " නම් මෙම තැනැත්තා වර්තමානයේදී වඩාත් හොඳින් විස්තර කෙරෙන රවුම(ම්) ලකුණු කරන්න.*

- ❍ නැත ➔ ඉදිරි ප්‍රශ්නයට යොමුවන්න.
- ❍ ඔව් උතුරු ඇමරිකානු ඉන්දියාන
- ❍ ඔව්, මෙටිස්
- ❍ ඔව්, ඉනුයිට් (එස්කිමෝ)

▶ ප්‍රශ්න අංක 20 කට යොමු වන්න.

---

**19.** මෙම තැනැත්තා:

*අදාළ වේ නම් එක් කවයකට වැඩි සංඛ්‍යාවක් ලකුණු කරන්න. නැතහොත් සඳහන් කරන්න.*

*මෙම තොරතුරු රැස්කරනු ලබන්නේ, කැනඩාවේ සමාජ, සංස්කෘතික හා ආර්ථික දිවිය සැම දෙනාහටම එකසේ බෙදාහදා ගැනීමේ සමාන අවස්ථා ප්‍රවර්ධනය කරන වැඩ සටහන් සඳහා සහයෝගය දැක්වීම පිණිසයි.*

- ❍ සුදු ජාතිකයෙකි
- ❍ චීන ජතිකයෙකි
- ❍ දකුණු ආසියානුවෙකි. *( උදා: නැගෙනහිර ඉන්දිය, පකිස්ථානු, ශ්‍රී ලාංකික ආදී)*
- ❍ කළු ජාතිකයෙකි.
- ❍ පිලිපීන ජාතිකයෙකි.
- ❍ ලතින් ඇමරිකානුවෙකි.
- ❍ ගිණිකොණදිග ආසියානුවෙකි. *(උදා: වියට්නාම් ජාතික කාම්බෝජ ජාතික , ලාඕස/ජාතික)*
- ❍ අරාබි ජාතිකයෙකි.
- ❍ බටහිර ආසියානුවෙකි. *(උදා: ඉරාන ජාතික, ඇෆ්ගනිස්ථාන් ජාතික ආදී)*
- ❍ කොරියානු ජාතිකයෙකි.
- ❍ ජපාන ජාතිකයෙකි.

වෙනත් — *සඳහන් කරන්න.*

______________________________

---

**20.** මෙම තැනැත්තා උතුරු ඇමරිකානු ඉන්දියානු ජන කණ්ඩායමක/ මුල් ජාතික සාමාජිකයෙක් වේද?

- ❍ නැත
- ❍ ඔව්, උතුරු ඇමරිකානු ඉන්දියානු ජන කණ්ඩායමක / මුල් ජාතික සාමාජිකයෙකි.

🡣

*ඉන්දියානු ජනකණ්ඩායම/ මුල් ජාතිය (උදා: මස්කියම්) සඳහන් කරන්න.*

______________________________

---

**21.** මෙම තැනැත්තා කැනඩාවේ (උතුරු ඇමරිකානු) ඉන්දියානු පනතේ අර්ථ කථනයට අනුව සම්මුති ඉන්දියානුවෙක් ද නැතහොත් ලියාපදිංචි ඉන්දියානුවෙක්ද ?

- ❍ නැත
- ❍ ඔව්, සම්මුති ඉන්දියානුවෙකි නැතහොත් ලියාපදිංචි ඉන්දියානුවෙකි.

---

සචලතාව

**23.** එක් වසරකට පෙර එනම් **2005** මැයි **16** වන දින මෙම තැනැත්තා වාසය කළේ කොහිද?

*එක් රවුමක් පමණක් ලකුණු කරන්න.*

*සටහන* **:**

*තෙවැනි රවුම සලකුණු කරන තැනැත්තන් :*
*කරුණාකර අදාල ප්‍රදේශය එහි කොටසක් වන පුරවරයේ නම වෙනුවට නගරයේ හෝ උප නගරයේ නම සඳහන් කරන්න.*

*උදාහරණ :*

- *වික්ටෝරියා (පුරවරය) වෙනුවට සානිච්;*
- *එඩ්මන්ටන් (පුරවරය) වෙනුවට සෙන්ට් ඇල්බර්ට්;*
- *මොන්ට්‍රියල් (පුරවරය) වෙනුවට ලැවල්.*

❍ වර්තමානයේදී මෙන් එම ලිපිනයේම වාසය කළේය.

❍ එම නගරයේ හෝ උපනගරයේ, ග්‍රාමයේ, නාගරිකයේ, මහනගර සහා බල ප්‍රදේශයේ හෝ ඉන්දියානු රක්ෂිතයේ වෙනත් ලිපිනයක වාසය කළේය.

❍ කැනඩාවේ වෙනත් නගරයක, උපනගරයක, ග්‍රාමයක, නාගරිකයක, මහ නගර සහා බලප්‍රදේශයේ හෝ ඉන්දයානු රක්ෂිතයක වාසය කළේය.

↓

නගරයේ, උප නගරයේ, ග්‍රාමයේ, නාගරිකයේ නගර සහා බල ප්‍රදේශයේ හෝ ඉන්දියානු රක්ෂිතයේ නම සඳහන් කරන්න.

______________________________

______________________________

පළාත / ප්‍රාන්තය

______________________________

තැපැල් සංකේතය

_________ _________

❍ කැනඩාවෙන් පිට වාසය කළේය.

↓

*ඒ රටේ නම සඳහන් කරන්න.*

______________________________

---

**24.** මීට වසර පහකට පෙර එනම් 2001 මැයි 16 වන දින මෙම තැනැත්තා වාසය කළේ කොහිද?

*එක් රවුමක් පමණක් ලකුණු කරන්න.*

*සටහන:*

*තෙවැනි රවුම සලකුණු කරන තැනැත්තන්:*

*කරුණාකර අදාළ ප්‍රදේශය එහි කොටසක් වන පුරවරයේ නම වෙනුවට නගරයේ හෝ උප නගරයේ නම සඳහන් කරන්න.*

*උදාහරණ :*

- *වික්ටෝරියා (පුරවරය) වෙනුවට සානිච්;*
- *එඩ්මන්ටන් (පුරවරය) වෙනුවට සෙන්ට් ඇල්බර්ට්;*
- *මොන්ට්‍රියල් (පුරවරය) වෙනුවට ලැවෙල්.*

○ වර්තමානයේදී මෙන් එම ලිපිනයේම වාසය කළේය.

○ එම නගරයේ හෝ උපනගරයේ, ග්‍රාමයේ,නාගරිකයේ, මහනගර සභා බල ප්‍රදේශයේ හෝ ඉන්දියානු රක්ෂිතයේ වෙනත් ලිපිනයක වාසය කළේය.

○ කැනඩාවේ වෙනත් නගරයක, උපනගරයක, ග්‍රාමයක, නාගරිකයක, මහ නගර සභා බලප්‍රදේශයේ හෝ ඉන්දියානු රක්ෂිතයක වාසය කළේය.

↓

නගරයේ, උප නගරයේ, ග්‍රමයේ, නාගරිකයේ නගර සභා බල ප්‍රදේශයේ හෝ ඉන්දියානු රක්ෂිතයේ නම සඳහන් කරන්න.

____________________

____________________

පළාත/ ප්‍රාන්තය

____________________

තැපැල් සංකේතය

________ ________

○ කැනඩාවෙන් පිට වාසය කළේය.

↓

*ඒ රටේ නම සඳහන් කරන්න.*

____________________

## දෙමව්පියන්ගේ උපන් ස්ථාන .

**25.** මෙම තැනැත්තාගේ මව හා පියා උපත ලබා ඇත්තේ කොහිද ?

(අ) පියා

*වර්තමාන දේශසීමාවන්ට අනුව අදාල රට ලකුණු කරන්න නැතහොත් සඳහන් කරන්න.*

පියා

- ❍ කැනඩාවේ උපත ලබා ඇත.

කැනඩාවෙන් පිටත උපත ලබා ඇත්නම්

*එම රට සඳහන් කරන්න.*

______________________________

(ආ) මව

*වර්තමාන දේශසීමාවන්ට අනුව අදාල රට ලකුණු කරන්න නැතහොත් සඳහන් කරන්න.*

මව

- ❍ කැනඩාවේ උපත ලබා ඇත.

කැනඩාවෙන් පිටත උපත ලබා ඇත්නම්

*එම රට සඳහන් කරන්න.*

______________________________

---

## අධ්‍යාපනය

**26.** මෙම තැනැත්තා ද්විතිය (උසස්) පාසල් ඩිප්ලෝමාව හෝ සමාන සුදුසුකම් සපුරා තිබේද?

*ද්විතිය (උසස්) පාසල් සහතිකයට සමාන සහතික වන්නේ පොදු අධ්‍යාපන සංවර්ධන **(GED)** සහ වැඩිහිටි මූලික අධ්‍යාපන **(ABE)** සහතිකයි.*

ද්විතික (උසස්) පාසල් ඩිප්ලෝමාව හෝ සහතිකය.

- ❍ ඔව්, ද්විතික (උසස්) පාසල් ඩිප්ලෝමා
- ❍ ඔව්, ද්විතික (උසස්) සමානතා සහතිකය
- ❍ නැත.

---

**27.** මෙම තැනැත්තා ලියාපදිංචි ආධුනිකත්ව හෝ වෙනත් වෘත්තිය සහතිකපත්‍ර පාඨමාලාවක් හෝ ඩිප්ලෝමාවක් සම්පූර්ණ කර තිබේද ?

*අදාලවන සෑම රවුමක්ම ලකුණු කරන්න.*

*උදාහරණ :*
- *කොණ්ඩා මෝස්තර ශිල්පය*
- *සී.එන්.සී.කාර්මික*

ලියාපදිංචි ආධුනිකයෙක් හෝ වෘත්තිය සහතිකපත්‍ර ලාභියෙක් හෝ ඩිප්ලෝමාධාරියෙක් වේ.

❍ ඔව්, ලියාපදිංචි ආධුනිකත්ව සහතිකය
❍ ඔව්, වෙනත් වෘත්තිය සහතිකය හෝ ඩිප්ලෝමා
❍ නැත

---

**28.** මෙම තැනැත්තා විද්‍යාලීය, **C.E.G.E.P**. හෝ වෙනත් විශ්වවිද්‍යාලීය නොවන සහතිකපත්‍රයක් හෝ ඩිප්ලෝමාවක් ලබා තිබේද ?

*අදාලවන සෑම රවුමක්ම ලකුණු කරන්න.*

*උදාහරණ :*
- *ගණකාධිකරණ තාක්ෂණය*
- *දේපල වෙළඳ නියෝජිත*
- *කර්මාන්ත ඉංජිනේරු තාක්ෂණය*

විද්‍යාලීය **C.E.G.E.P** සහ වෙනත් විශ්වවිද්‍යාලීය නොවන සහතික පත්‍රය හෝ ඩිප්ලෝමාව

❍ ඔව්, මාස තුනකට අඩු පාඨමාලාවකින් ලබාගත් සහතික පත්‍රය හෝ ඩිප්ලෝමාව
❍ ඔව්, මාස තුනේ සිට අවුරුදු 1 දක්වා වූ පාඨමාලාවකින් ලබාගත් සහතික පත්‍රය හෝ ඩිප්ලෝමාව
❍ ඔව්, අවුරුදු 1 සිට 2 දක්වා වූ පාඨමාලාවකින් ලබාගත් සහතික පත්‍රය හෝ ඩිප්ලෝමාව
❍ ඔව් , අවුරුදු 2 ට වැඩි පාඨමාලාවකින් ලබාගත් සහතික පත්‍රය හෝ ඩිප්ලෝමාව
❍ නැත.

---

**29.** මෙම තැනැත්තා විශ්වවිද්‍යාල උපාධි, සහතික පත්‍ර හෝ ඩිප්ලෝමා පාඨමාලාවක් හදාරා තිබේද ?

*අදාලවන සෑම රවුමක්ම ලකුණු කරන්න.*

විශ්වවිද්‍යාල උපාධි, සහතික පත්‍ර හෝ ඩිප්ලෝමා

❍ ඔව්, ප්‍රථම උපාධි මට්ටමට පහළ සහතික පත්‍රය හෝ ඩිප්ලෝමාව.
❍ ඔව්, ප්‍රථම උපාධිය (නීතිවේදී උපාධිය ඇතුළුව)
❍ ඔව්, ප්‍රථම උපාධි මට්ටමට ඉහළ සහතික පත්‍රය හෝ ඩිප්ලෝමාව.
❍ ඔව්, ශාස්ත්‍රපති උපාධිය.
❍ ඔව්, වෛද්‍ය විද්‍යාව, දන්ත වෛද්‍ය විද්‍යාව, පශු වෛද්‍ය විද්‍යාව, හෝ දෘෂ්ටිමිතිය යන ක්ෂේත්‍රයන්හි උපාධිය.
❍ ඔව්, ආචාර්ය උපාධිය හිමිකරගෙන ඇත.
❍ නැත.

---

**30.** මෙම තැනැත්තා සම්පූර්ණකර ඇති ඉහළම උපාධි, සහතිකපත්‍ර හෝ ඩිප්ලෝමා අධ්‍යයන ක්ෂේත්‍රය කුමක්ද ?

*කරුණාකර අදාළ ක්ෂේත්‍ර නිශ්චිතව දක්වන්න - උදාහරණ :*

- *මෝටර්රථ වාහන කාර්මික ශිල්පය*
- *සිවිල් ඉංජිනේරු*
- *දන්ත තාක්ෂණවේදය*
- *ගුවන්යානා කාර්මික ශිල්පය*
- *වෛද්‍ය රසායනාගාර තාක්ෂණවේදය*
- *දිවා- සුරැකුම්*
- *කෘෂි ආර්ථික*

ඉහළම උපාධි, සහතික පත්‍ර හෝ ඩිප්ලෝමා අධ්‍යයන ක්ෂේත්‍රය.

______________________________

______________________________

______________________________

______________________________

හෝ

❍ (උසස් පාසල් මට්ටමට වඩා උසස් වූ) සහතික පත්‍රයක් හෝ ඩිප්ලෝමාවක් නැත. ▶ ප්‍රශ්න අංක **32** ට යොමුවන්න.

---

**31.** මෙම තැනැත්තා තමාගේ ඉහළම උපාධි, සහතිකපත්‍ර හෝ ඩිප්ලෝමා පාඨමාලා සම්පූර්ණ කළේ කුමන පළාතේ, ප්‍රාන්තයේ, හෝ රටේ දී ද ?

කැනඩාවේ.

*පළාත හෝ ටෙරිටොරි සඳහන් කරන්න.*

______________________________

හෝ

කැනඩාවෙන් බැහැරව.

*අදාළ රට සඳහන් කරන්න.*

______________________________

---

**32.** මෙම තැනැත්තා 2005 සැප්තැම්බර් මස සිට කවර හෝ අවස්ථාවක යම් පාසලක, විද්‍යාලයක, **C.E.G.E.P.** හෝ විශ්වවිද්‍යාලයක අධ්‍යාපනය ලබා තිබේද ?

*අදාළවන සෑම රවුමක්ම ලකුණු කරන්න.*

❍ ඔව්, මූලික, කණිෂ්ඨ උසස් පාසලක හෝ උසස් පාසලක අධ්‍යාපනය ලබා ඇත.

❍ ඔව්, වෘත්තීය පාසලක, විද්‍යාලයක, **C.E.G.E.P** හෝ වෙනත් විශ්වවිද්‍යාල නොවන ආයතනක අධ්‍යාපනය ලබාඇත.

❍ ඔව්, විශ්ව විද්‍යාලයක අධ්‍යාපනය ලැබීය.

❍ නැත. 2005 සැප්තැම්බර් මස සිට කවර හෝ අවස්ථාවක යම් පාසලක අධ්‍යාපනය ලබා නැත.

---

## ගෘහස්ථ ක්‍රියාකාරකම්

***සටහන :***

***"පසුගිය සතිය" යන්නෙන් 2006 මැයි මස 7 වන දින සිට මැයි මස 13 වන දින අතර කාලය අදහස් වේ..***

***ප්‍රශ්න අංක 33 සඳහා එකම අවස්ථාවක ක්‍රියාකාරකම් දෙකක් හෝ ඊට වැඩි සංඛ්‍යාවක් සිදුවූවද ඒ එක් එක් ක්‍රියාකාරකම සඳහා ගතවූ කාලය සඳහන් කරන්න.***

**33.** මෙම තැනැත්තා පසුගිය සතිය තුළ පහත සඳහන් ක්‍රියාකාරකම් ඉටු කිරීමට කොපමණ කාලයක් ගත කළේද ? :

(අ) ගාස්තු නොගෙවන දෙර දොරේ වැඩ, ගෙමිදුලේ වැඩ, හෝ මෙම පවුලේ හෝ වෙනත් පවුල්වල සාමාජිකයන් සඳහා තිවෙස් නඩත්තු කටයුතු ?

*ඊට උදාහරණ කිහිපයක් නම් ආහාර පිළියෙල කිරීම, මෝටර් රථය සේදීම, රෙදි සේදීම, තණකොළ කැපීම, කඩයට යෑම, ගෘහ සැළසුම් කිරීම ආදිය..*

- ❍ කිසිවක් නැත.
- ❍ පැය **5** ට අඩු
- ❍ පැය **5** සිට **14** දක්වා
- ❍ පැය **15** සිට **29** දක්වා
- ❍ පැය **30** සිට **59** දක්වා
- ❍ පැය **60** හෝ ඊට වැඩි

(ආ) මෙම තැනැත්තාගේම හෝ වෙනත් අයෙකුගේ එක් දරුවකු හෝ ඊට වැඩි ගණනක් ගෙවීමකින් තොරව රැකබලා ගත්තේ ද?

*ඊට උදාහරණ කිහිපයක් නම් තරුණ දරුවන් නැවීම, හා ඔවුන් සමග සෙල්ලම් කිරීම, ළමයින් ක්‍රීඩා කටයුතු සඳහා රැගෙන යෑම, හෝ ඔවුන්ගේ ගෙදර වැඩ වලට සහය වීම, නව යොවුන් දරුවන් සමග ඔවුන්ගේ ගැටළු පිළිබඳව සාකච්ඡා කිරීම ආදිය.*

- ❍ කිසිවක් නැත
- ❍ පැය **5** ට අඩු
- ❍ පැය **5** සිට පැය **14** දක්වා
- ❍ පැය **15** සිට **29** දක්වා
- ❍ පැය **30** සිට **59** දක්වා
- ❍ පැය **60** හෝ ඊට වැඩි

(ඇ) වැඩිහිටි එක් පුද්ගලයකුට හෝ වැඩි ගණනකට ගෙවීමකින් තොරව රැකවරණ හෝ උපකාර සලසත්තේ ද?

*ඊට උදාහරණ කිහිපයක් නම් පවුලේ ජ්‍යෙෂ්ඨ සාමාජිකයකුට රැකවරණ සැළසීම, වැඩිහිටියන් බැලීමට යෑම, ඔවුන් සමග දුරකථනයෙන් කථා කිරීම, සාප්පු යෑමේදී , බැංකු කටයුතුවලදී ඔවුන්ට උදව්වීම, හෝ බෙහෙත් රැගෙන දීම ආදිය.*

- ❍ කිසිවක් නැත.
- ❍ පැය **5** ට අඩු
- ❍ පැය **5** සිට **9** දක්වා
- ❍ පැය **10** සිට **19** දක්වා
- ❍ පැය **20** හෝ ඊට වැඩි

ශ්‍රම වෙළඳ පොළ කටයුතු

**34.** මෙම තැනැත්තා පසුගිය සතියේ වැටුප් ලබන හෝ ස්වයං රැකියාවක කොපමණ පැය ගණනක් සේවයේ නියුක්තව සිටියේද?

*කරුණාකර පසුගිය සතිය තුළ දැරූ සියලු රැකියාවලදී වැටුපට හෝ ස්වයං රැකියාවක හෝ වැඩ කළ පැය ගණනේ එකතුව සඳහන් කරන්න.*

- *වේතන , වැටුප්, පාරිතෝෂික හෝ කොමිස් සඳහා වැඩ කිරීම :*
- *තමාගේම ව්‍යාපාරයක, ගොවිපලක හෝ වෘත්තීය කටයුත්තක තනිව හෝ හවුලේ වැඩ කිරීම :*
- *විධිමත් වැටුප් ගෙවීමේ වැඩ පිළිවෙළකින් තොරව පවුලේ ගොවිපලක් හෝ ව්‍යාපාරයක් පවත්වාගෙන යෑමට සෘජු ලෙස සම්බන්ධව වැඩ කිරීම. (උදාː වැපිරීමේදී හා ගිණුම තැබීමේදී සහයවීම)*

( ආසන්නම පැයට) පැය ගණන

____________ ➔ ප්‍රශ්න අංක **40** ට යොමුවන්න.

හෝ

❍ කිසිවක් නැත ➔ මීළඟ ප්‍රශ්නයට යොමුවන්න.

---

**35.** මෙම තැනැත්තා පසුගිය සතියේ තාවකාලිකව ඔහුගේ/ ඇයගේ රැකියාවෙන් හෝ ව්‍යාපාරයෙන් ඉවත්ව හෝ නොපැමිණ සිටියේ ද?

*එක් රවුමක් පමණක් ලකුණු කරන්න.*

❍ නැත
❍ ඔව්, යම් රැකියාවකින් තාවකාලිකව ඉවත්ව සිටියද ඔහු/ඇය එම රැකියාවට නැවත යාමට අපේක්ෂා කරයි.
❍ ඔව්, නිවාඩු කාලය, අසනීපය, වැඩ වර්ජන හෝ වැඩ පොළට යෑම අවහිර කිරීම, හෝ වෙනත් හේතූන් මත වැඩට නොපැමිණීම.

---

**36.** ඉදිරි සති හතර ඇතුළත නව රැකියාවක් ඇරඹීමට නිශ්චිත වැඩ පිළිවෙළක් පසුගිය සතියේ මෙම තැනැත්තාට තිබුණේද?

❍ නැත
❍ ඔව්

---

**37.** මෙම තැනැත්තා පසුගිය සති හතර තුළ වැටුප් ලබන වැඩ සොයමින් සිටියේ ද?

*උදාහරණ : මෙම තැනැත්තා යම් රැකියා මධ්‍යස්ථානයක් ඇමතුරවේද, සේවායෝජකයන් වෙතින් සොයා බැලුවේද, පුවත්පත් වෙළඳ දැන්වීම් පළකළේද නැතහොත් ඒවාට පිළිතුරු සැපයී ද, ආදිය ?*

*එක් රවුමක් පමණක් ලකුණු කරන්න.*

❍ නැත ➔ ප්‍රශ්න අංක **39** ට යොමුවන්න.
❍ ඔව්, පූර්ණකාලීන වැඩ සොයා බැලුවේය.
❍ ඔව්, අර්ධකාලීන වැඩ (සතියකට පැය **30** ට අඩු ) සොයා බැලුවේය.

---

**38.** යම් රැකියා අවස්ථාවක් තිබුනේ නම් මෙම තැනැත්තාට පසුගිය සතියේ යම් රැකියාවක් ආරම්භ කළ හැකිව තිබුණේ ද?

*එක් රවුමක් පමණක් ලකුණු කරන්න.*

- ❍ ඔව්, රැකියාවක් ආරම්භ කළ හැකිව තිබුණි.
- ❍ නැත. ඒ වන විට රැකියාවක් තිබුණි.
- ❍ නැත. තාවකාලික අසනීප හෝ ආබාධිත තත්ත්වයක් හේතුවෙන්.
- ❍ නැත. පෞද්ගලික හෝ පවුලේ වගකීම් හේතුවෙන්
- ❍ නැත. පාසල් අධ්‍යාපනය ලබයි.
- ❍ නැත. වෙනත් හේතූන් මත.

---

**39.** මෙම තැනැත්තා දින කීපයකට හෝ වැටුප් ලබන හෝ ස්වයං රැකියාවක අවසාන වශයෙන් වැඩ කළේ කවදාද ?

*එක් රවුමක් පමණක් ලකුණු කරන්න.*

- ❍ **2006** වර්ෂයේදී ➔ මීළඟ ප්‍රශ්නයට යොමුවන්න.
- ❍ **2005** වර්ෂයේදී ➔ මීළඟ ප්‍රශ්නයට යොමුවන්න.
- ❍ **2005** වර්ෂයටපෙර ➔ ප්‍රශ්න අංක **51** ට යොමුවන්න.
- ❍ කිසිදා නැත. ➔ ප්‍රශ්න අංක **51** ට යොමුවන්න.

---

සටහන : අංක 40 සිට 48 දක්වා වූ ප්‍රශ්න මෙම තැනැත්තා පසුගිය සතියේ නියුක්ත වූ රැකියාව හෝ ව්‍යාපාරය සම්බන්ධයෙන් වේ.

*මෙම තැනැත්තා පසුගිය සතියේ කිසිදු රැකියාවක් නොදැරුවේ නම් **2005** ජනවාරි **1** වන දින සිට දීර්ඝතම කාලයක් දැරූ රැකියාවට අදාළව පිළිතුරු දෙන්න. මෙම තැනැත්තා පසුගිය සතියේ එක් රැකියාවකට වඩා වැඩි ගණනක් දැරුවේ නම් ඔහු/ඇය විසින් වැඩිම පැය ගණනක් සේවය කරන ලද රැකියාවට අදාළව පිළිතුරු දෙන්න.*

**40.** *මෙම තැනැත්තා වැඩ කළේ කා සඳහා ද?*

*ස්වයං රැකියාවල නියුක්ත තැනැත්තන් ඔවුන්ගේ ව්‍යාපාරයේ නම සඳහන් කරන්න. ව්‍යාපාරයට නමක් නොමැති නම් පුද්ගලයාගේ නම සඳහන් කරන්න.*

*පහත දැක්වෙන පරිදි පැහැදිලි ලොකු අකුරින් ලියන්න.*

ආයතනයේ, රජයේ නියෝජිතායතනයේ ආදීයෙහි නම :

**<u>A B C   C O N C R E T E   P R O D U C T S   L I M I T E D</u>**

ආයතනයේ රජයේ නියෝජිතායතනයේ ආදියෙහි නම්.

________________________________

________________________________

________________________________

________________________________

(අදාළ නම් ) අංශය, කර්මාන්ත ශාලාව, දෙපාර්තමේන්තුව ආදිය.

________________________________

________________________________

---

**41.** එය කුමන වර්ගයක ව්‍යාපාරයක්, කර්මාන්තයක් හෝ සේවාවක් ද?

කරුණාකර විස්තර සපයන්න. උදාහරණ

- *නව නිවාස ඉදිකිරීම.*
- *ප්‍රාථමික පාසල්*
- *නාගරික පොලීසිය*
- *තිරිඟු ගොවිපල*
- *සපත්තු ගබඩාව*
- *ආහාර තොග වෙළඳාම*
- *මෝටර් රථ කොටස් කම්හල*

ව්‍යාපාරයේ, කර්මාන්තයේ හෝ සේවාවේ ස්වභාවය.

________________________________________
________________________________________
________________________________________

---

**42.** මෙම තැනැත්තාගේ කාර්යය හෝ රැකියාව කුමක්විද?

කරුණාකර නිශ්චිතව දක්වන්න. උදාහරණ :

- *නීති ලේකම්*
- *ජලනල කාර්මික*
- *ධීවර නියාමක*
- *දැව ගෘහ භාණ්ඩ එකලස්කරු*
- *ද්විතික පාසල් ගුරුවරයා*

*(යුධ හමුදාවක නම් නිලය සඳහන් කරන්න )*

රැකියාව

________________________________________
________________________________________
________________________________________

---

**43.** මෙම කාර්යයේදී මෙම තැනැත්තාගේ ප්‍රධාන ක්‍රියාකාරකම් වූයේ මොනවාද ?

කරුණාකර සවිස්තර සපයන්න. උදාහරණ :

- *නීති ලිපිලේඛන සැකසීම.*
- *ගෘහස්ථ ජලනල සවිකිරීම*
- *ධීවර කණ්ඩායම් වලට මග පෙන්වීම.*
- *දැව ගෘහ භාණ්ඩ සෑදීම.*
- *ගණිතය ඉගැන්වීම.*

ප්‍රධාන ක්‍රියාකාරකම්

________________________________________
________________________________________
________________________________________

---

**44.** මෙම රැකියාවේදී හෝ ව්‍යාපාරයේදී මෙම තැනැත්තා ප්‍රධාන වශයෙන්

*එක් රවුමක් පමණක් ලකුණු කරන්න.*

- ❍ වේතන, වැටුප්, පාරිතෝෂික හෝ කොමිස් මත වැඩ කළේද? ➔ ප්‍රශ්න අංක **46** ට යොමුවන්න.
- ❍ ඔහුගේ/ඇයගේ කලත්‍රයාට හෝ වෙනත් ඥාතියෙකුට අයත් පවුලේ ගොවිපලක හෝ ව්‍යාපාරයක වැටුප් රහිතව වැඩ කළේද? ➔ ප්‍රශ්න අංක **46** ට යොමුවන්න.
- ❍ වැටුප් ගෙවන සහායකයකුගේ උදව්, නොමැතිව ස්වයං රැකියාවක නියුක්ත විද? (තනිව හෝ හවුල් ව්‍යාපාරයක )
- ❍ වැටුප් ගෙවන සහායකයකුගේ උදව් ඇතිව ස්වයං රැකියාවක නියුක්ත විද? (තනිව හෝ හවුල් ව්‍යාපාරයක )


---

**45.** ස්වයං රැකියාවක නියැලේ නම්, මෙම තැනැත්තාගේ ගොවිපල හෝ ව්‍යාපාරය සංස්ථාගත කර තිබේද?

- ❍ නැත
- ❍ ඔව්.

---

**46.** ස්වයං රැකියාවක නියැලේ නම්, මෙම තැනැත්තාගේ ගොවිපල හෝ ව්‍යාපාරය සංස්ථාගත කර තිබේද?




*දිශාව (උදා: **North** (උතුර) **South** (දකුණ) **East** (නැගෙනහිර) හෝ **West** (බටහිර )) විදි ලිපිනයෙහි කොටසක් වේ නම් කරුණාකර එය ඇතුළත් කරන්න.*

*විදි ලිපිනය නොදන්නේ නම් හෝ ලිපිනය තැපැල් පෙට්ටියක් නම් අදාළ ගොඩනැගිල්ල හෝ ආසන්නතම හරස් විදිය නිවැරදිව සඳහන් කරන්න. තැපැල් පෙට්ටි අංකයක් සඳහන් නොකරන්න.*

*කරුණාකර අදාළ ප්‍රදේශය එහි කොටසක් වන පුරවරය සඳහන් නොකර නගරයේ හෝ උප නගරයේ නම සඳහන් කරන්න.*

*උදාහරණ :*

- *වික්ටෝරියා (පුරවරය) වෙනුවට සානිච්;*
- *එඩ්මන්ටන් (පුරවරය) වෙනුවට සෙන්ට් ඇල්බර්ට් ;*
- *මොන්ට්‍රියල් (පුරවරය) වෙනුවට ලැවල්.*

*වැඩ කරන ලිපිනය, සේවා යෝජකයාගේ ලිපිනයෙන් වෙනස්වේ නම්, මෙම පුද්ගලයා සත්‍ය වශයෙන් වැඩ කරන ස්ථානයේ ලිපිනය සඳහන් කරන්න. (උදා : පාසල් ගුරුවරුන් විසින් ලබාදිය යුත්තේ පාසල් මණ්ඩලයේ ලිපිනය නොව තම පාසලේ ලිපිනයයි.)*

❍ ගෙදර වැඩ කලේය (ගොවිපලවල්ද ඇතුළුව) ➔ ප්‍රශ්න අංක 48 ට යොමුවන්න.
❍ කැනඩාවෙන් පිට වැඩ කළේ ය ➔ ප්‍රශ්න අංක 48 ට යොමුවන්න.
❍ ස්ථිර වැඩපල ලිපිනයක් නැත. ➔ ප්‍රශ්න අංක 47 ට යොමුවන්න
❍ පහත සඳහන් ලිපිනයෙහි වැඩ කලේය.:

සම්පූර්ණ ලිපිනය සඳහන් කරන්න.

විදි ලිපිනය (උදාහරණය බලන්න)

______________________________________

______________________________________

______________________________________

නගරය, උපනගරය, ග්‍රාමය, නාගරිකය, මහනගර සභාව, හෝ ඉන්දියානු රක්ෂිතය.

______________________________________

______________________________________

පළාත/ ප්‍රාන්තය

______________________________________

තැපැල් සංකේතය

__________ __________

---

**47.** මෙම තැනැත්තා සාමාන්‍යයෙන් වැඩට යන්නේ කෙසේද?

*මෙම තැනැත්තා එක් ගමනාගමන ක්‍රමයකට වඩා වැඩි ගණනක් භාවිතා කලේ නම් වැඩිම දුරක් යැමට යොදාගත් ක්‍රමය ලකුණු කරන්න.*

❍ මෝටර් රථය, ට්‍රක් රථය හෝ වෑන් රථය — රියදුරු වශයෙන්
❍ මෝටර් රථය ට්‍රක් රථය හෝ වෑන් රථය — මගියකු වශයෙන්
❍ පොදු ප්‍රවාහන (උදා: බසය, වීදි රථය, උමං දුම්රිය, සැහැල්ලු දුම්රිය ප්‍රවාහන, මගී දුම්රිය, පාරුව)
❍ රක්ෂාවට පයින් යැම.
❍ බයිසිකලය
❍ මෝටර් බයිසිකලය
❍ ටැක්සි රථය
❍ වෙනත් ක්‍රමයක්.

---

**48.** (අ) මෙම රැකියාවේදී මෙම තැනැත්තා බොහෝ කොට භාවිත කළ භාෂාව කුමක්ද ?

- ❍ ඉංග්‍රීසි
- ❍ ප්‍රංශ

*වෙනත් — සඳහන් කරන්න.*

________________________________

(ආ) මෙම තැනැත්තා මේ රැකියාවේදී වෙනත් භාෂාවන් නිරන්තරයෙන් භාවිත කළේද?

- ❍ නැත
- ❍ ඔව්, ඉංග්‍රීසි
- ❍ ඔව්, ප්‍රංශ

ඔව් - වෙනත් - *සඳහන් කරන්න.*

________________________________

---

**49.** මෙම තැනැත්තා **2005** වර්ෂයේදී කොපමණ සති ගණනක් වැඩ කළේ ද?

*කරුණාකර **2005** වර්ෂයේ දැරූ සියලු රැකියාවලදී වැටුප් ලබන හෝ ස්වයං- රැකියා සඳහා වැඩ කළ මුළු සති ගණන සඳහන් කරන්න.*

*මෙම තැනැත්තා :–*

- *වැටුප් සහිතව විවේක නිවාඩු පිට හෝ ලෙඩ නිවාඩු පිට සිටි;*
- *පූර්ණ කාලීනව හෝ අර්ධ කාලීනව වැඩ කළ;*
- *වේතන, වැටුප්, පාරිතෝෂික හෝ කොමිස් මත වැඩ කළ ;*
- *ස්වයං රැකියාවක නියුක්ත වූ ;*
- *විධිමත් වැටුප් ගෙවීමේ ක්‍රමයකින් තොරව පවුලේ ගොවිපලක් හෝ ව්‍යාපාරයක් මෙහෙයවීමට ඍජුව ක්‍රියා කළ :*

*සති ගණන ද ඇතුළත් කරන්න.*

❍ කිසිවක් නැත. ➔ ප්‍රශ්න අංක 51ට යොමු කරන්න.

හෝ

________________ ← සති ගණන

---

**50.** එම සති අතුරෙන් වැඩිම කලක් මෙම තැනැත්තා පූර්ණ කාලීනව හෝ අර්ධ කාලීනව වැඩ කළේ ද?

*එක් රවුමක් පමණක් ලකුණු කරන්න.*

- ❍ පූර්ණ කාලීන (සතියකට පැය **30** ක් හෝ ඊට වැඩි )
- ❍ අර්ධ කාලීන (සතියකට පැය **30** ට අඩු)

---

## 2005 වර්ෂයේ ආදායම

**51.** කාලය ඉතිරිකර ගැනීමට ප්‍රශ්න අංක **52** ට පිළිතුරු සැපයීම වෙනුවට දැනටමත් ඔහුගේ/ ඇයගේ ආදායම් බදු ලිපිගොනුවල ඇති තොරතුරු භාවිත කිරීම සඳහා ඒ එක් එක් තැනැත්තා විසින් කැනඩා සංඛ්‍යා ලේඛන ආයතනයට අවසර ලබාදිය හැක.

- *මෙම විකල්පය, 2005 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වන වර්ෂය සඳහා බදු වාර්තා ගොනුකළ තැනැත්තන් සඳහා පමණක් සීමාවේ.*
- *ඔබගේ ආදායම් බදු තොරතුරු සංඛ්‍යානමය අවශ්‍යතා සඳහා පමණක් භාවිත කරනු ලබන බව කරුණාවෙන් සලකන්න.*

මෙම තැනැත්තා **2005** දෙසැම්බර් **31** වන දිනෙන් අවසන්වන වර්ෂය සඳහා අදාළ දැනටමත් ඔහුගේ/ ඇයගේ/ ආදායම් බදු ලිපිගොනුවල ඇති තොරතුරු භාවිත කිරීම සඳහා කැනඩා සංඛ්‍යාලේඛන ආයතනයට අවසර ලබා දෙන්නේ ද?

❍ ඔව් ➔ **1** වන තැනැත්තා එකහවේ. ප්‍රශ්න අංක **53** ට යොමු වන්න.

❍ නැත ➔ ප්‍රශ්න අංක **52** ට යොමුවන්න.

---

**52.** **2005** දෙසැම්බර් **31** වන දිනෙන් අවසන්වන වර්ෂය තුළදී මෙම තැනැත්තාට පහත සඳහන් මූලාශ්‍රවලින් යම් ආදායමක් ලැබුනේ ද?

*සෑම මූලාශයක් සම්බන්ධයෙන්ම 'ඔව්' හෝ 'නැත' යනුවෙන් පිළිතුරු දෙන්න. 'ඔව්' නම්, මුදල ද සඳහන් කරන්න. "පාඩුව" නම් එම පාඩු වූ මුදල ද සඳහන් කරන්න.*

### වැටුප් ලබන රැකියා :

(අ) *යම් අඩුකිරීම් කිරීමට පෙර, කොමිස්, බෝනස්, පාරිතෝෂික, බදු අයකරන ප්‍රතිලාභ, පර්යේෂණ ප්‍රදාන, පුරස්කාර ආදිය ඇතුලත් මුළු වේතන සහ වැටුප්.*

❍ ඔව්

↳ $ ___ _______ _______.00

❍ නැත

---

### ස්වයං රැකියා :

(ආ) ගොවිපල - ආධාරක වැඩ සටහන් යටතේ හිමිවන ප්‍රදාන සහ සහනාධාර,අලෙවි මණ්ඩල ගෙවීම්, දළ රක්ෂණ ආදායම් ඇතුළු ශුද්ධ ගොවිපල ආදායම (දළ ඉපැයුම් වලින් වියදම් අඩු කර)

❍ ඔව්

↳ $ ___ _______ _______.00

❍ පාඩුව

❍ නැත.

(ඇ) සංස්ථාපනය නොකළ ව්‍යාපාර, වෘත්තියෙහි නියැලීම ආදියෙන් ලැබෙන ශුද්ධ ගොවිපල නොවන ආදායම (දළ ඉපැයිම්වලින් වියදම් අඩුකර )

❍ ඔව්

↳ $ ___ _______ _______ .00

❍ පාඩුව

❍ නැත

---

**රජයෙන් හිමිවන ආදායම්:**

(ඇ) ළමා බදු ප්‍රතිලාභ, පවුල් දීමනා (ෆේඩරල්, පළාත් සහ ප්‍රාන්ත) ආදී ළමා ප්‍රතිලාභ.

❍ ඔව්

↳ $ ___ _______ _______ .00

❍ නැත

(ඉ) ෆේඩරල් රජයෙන් පමණක් හිමිවන වැඩිහිටි ආරක්ෂණ විශ්‍රාම වැටුප්, සහතික කළ ආදායම් පරිපූර්ක, දීමනා සහ ප්‍රවර්ථන දීමනා (පළාත් ආදායම් පරිපූරක "ඌ" යටතේ දැක්විය යුතුය)

❍ ඔව්

↳ $ ___ _______ _______ .00

❍ නැත

(ඊ) කැනඩා හෝ ක්විබෙක් විශ්‍රාම වැටුප් සැලසුමෙන් හිමිවන ප්‍රතිලාභ

❍ ඔව්

↳ $ ___ _______ _______ .00

❍ නැත

(උ) රැකියා රක්ෂණයෙන් හිමවන ප්‍රතිලාභ (බදු අඩු කිරීමට පෙර මුළු ප්‍රතිලාභ)

❍ ඔව්

↳ $ ___ _______ _______ .00

❍ නැත

( උ) *පළාත් ආදායම් පරිපූරක හා ප්‍රදාන, **GST/QST/HST** ණය, පළාත් බදු ණය, සේවක වන්දි, කෘතහස්ත විශ්‍රාම වැටුප්, සුභසාධන ගෙවීම් ආදී රජයේ මූලාශ්‍ර වලින් හිමිවන අනෙකුත් ආදායම්.*

❍ ඔව්

↳ $ ___ _______ _______ .00

❍ නැත

---

වෙනත් ආදායම් :

(එ) ලාභාංශ, බැඳුම්කර, තැන්පතු, සහ ඉතුරුම් සහතික මත පොලිය සහ දේපල වලින් ලැබෙන ශුද්ධ කුලී, උකස් වලින් ලැබෙන පොලිය, ආදී අනෙකුත් ආයෝජන ආදායම් *ප්‍රාග්ධන ඉපැයීම්/ අලාභ ඇතුළත් නොකරන්න.*

❍ ඔව්

↳ $ ___ _______ _______ .00

❍ පාඩුව

❍ නැත

(ඒ) *RRSPs සහ RRIFs වලින් ලැබෙන ආදායම් ද ඇතුළුව විශ්‍රාම වැටුප් විශ්‍රාම පාරිතෝෂිකයා, සහ වාර්ෂික දීමනා. විශ්‍රාම වැටුප් මුදල් සහ RRSP මුදල්වලින් ආපසු ගත් මුදල් මෙහි ඇතුළත් නොකරනු.*

❍ ඔව්

↳ $ ___ _______ _______ .00

❍ නැත

(ඔ) දික්කසාද දීමනා, ළමා ආධාර මුදල්, ශිෂ්‍යත්ව ආදී අනෙකුත් මූල්‍යමය වත්කම්.

❍ ඔව්

↳ $ ___ _______ _______ .00

❍ නැත

---

**සියළුම මූලාශ්‍ර වලින් 2005 වර්ෂයේ ලද මුළු ආදායම**

- ❍ ඔව්
  - ↳ $ ___ _______ _______ .00
    - ❍ පාඩුව
- ❍ නැත

---

**2005 ආදායම මත ගෙවූ ආදායම් බද්ද (ෆෙඩරල්, පළාත් සහ ප්‍රාන්ත)**

▶ $ ___ _______ _______ .00

---

මීළඟ ප්‍රශ්නය, අවුරුදු **15** ට අඩු තැනැත්තන් ද ඇතුළුව සාමාන්‍යයෙන් මෙහි වෙසෙන සියලු තැනැත්තන් සඳහා අදාලවේ. ඔබ අනෙකුත් තැනැත්තන් වෙනුවෙන් පිළිතුරු සපයන්නේ නම් කරුණාකර ඒ එක් එක් තැනැත්තාගේ අදහස් ලබාගන්න.

**53.** ඔබගේ සංගණන තොරතුරුවල රහස්‍යභාවය, සංඛ්‍යා ලේඛන පනත මගින් සහතික කර ඇත. මෙම ප්‍රශ්නයට 'ඔව් ' යනුවෙන් ඔබ විසින් ලකුණු කළහොත් පමණක්, **2006** සංගණනයෙන් වර්ෂ **92** කට පසුව ඔබගේ පෞද්ගලික තොරතුරු ප්‍රසිද්ධ කරනු ලැබේ. ඔබ 'නැත' යනුවෙන් ලකුණු කළහොත් හෝ පිළිතුර හිස්ව තැබුවහොත් ඔබගේ පෞද්ගලික තොරතුරු කිසිදිනෙක ප්‍රසිද්ධියට පත් කරනු නොලැබේ.

මෙම තැනැත්තා **2006** සංගණනයේ ඔහුගේ/ ඇයගේ තොරතුරු **2098** දී ( සංගණනයෙන් වර්ෂ **92** කට පසුව) මහජනතාව වෙත ලබාදීමට එකඟ වන්නේ ද?

- ❍ ඔව්
- ❍ නැත

## ඊ පියවර

මෙම වාසස්ථානය පිළිබඳව **H** 1 සිට **H**8 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

*වාසස්ථානයක් යනුවෙන් පිටතින් හෝ යම් ගොඩනැගිල්ලක් ඇතුළත පොදු ශාලා මගක් හෝ තරප්පු පෙළක් තුළින් පෞද්ගලික පිවිසුමක් සහිත වෙන්වූ නිවෙස්නයක් අදහස් කෙරේ. මෙම පිවිසුම වෙනත් අයෙකුගේ නිවෙස්නයක් තුළින් නොතිබිය යුතුය.*

**H1.** මෙම වාසස්ථානය සඳහා නිවාස කුලිය හෝ,උකස, බදු, විදුලිය බිල, ආදිය ගෙවනු ලබන්නේ කවුරුන් විසින් ද?

*එම ගෙවීම් සඳහා එක් තැනැත්තකුට වඩා වැඩි ගණනක් දායක වන්නේ නම් අදාළ වන සෑම රවුමක්ම ලකුණු කරන්න.*

- ❍ 1 වන තැනැත්තා
- ❍ 2 වන තැනැත්තා
- ❍ 3 වන තැනැත්තා
- ❍ 4 වන තැනැත්තා
- ❍ 5 වන තැනැත්තා
- ❍ මෙම වාසස්ථානය සඳහා වෙනත් ප්‍රශ්නාවලියකට ඇතුළත් කර ඇති තැනැත්තෙක්
- ❍ මෙහි වාසය නොකරන තැනැත්තෙක්

---

**H2.** මෙම වාසස්ථානය :

*එක් රවුමක් පමණක් ලකුණු කරන්න.*

- ❍ ඔබට හෝ මෙම කුටුම්භයේ වෙනත් සාමාජිකයකුට අයිති වන්නේ ද ? (එයට තවමත් ගෙවීම් කළද)
- ❍ කුලියට (මුදලින් කුලියක් නොගෙවුවද ) ලබාගෙන ඇත්ද ?

---

**H3.** (අ) මෙම වාසස්ථානයේ කාමර කොපමණ සංඛ්‍යාවක් ඇත්ද?

*මුළුතැන්ගෙය, නිදන කාමර, සොල්දරයේ හෝ පතුල්මාලයේ නිම කළ කාමර ආදිය ඇතුළත් කරන්න.*

*නාන කාමර, ශාලා, ප්‍රවේශ ශාලා, හා හුදෙක් ව්‍යාපාරික කාර්යයන් සඳහා පමණක් යොදා ගන්නා කාමර ඇතුළත් නොකරන්න.*

______ ← කාමර සංඛ්‍යාව

(ආ) මෙම කාමර අතර නිදන කාමර ගණන කියද**?**

______ ← නිදන කාමර සංඛ්‍යාව

---

**H4.** මෙම වාසස්ථානය මුලින් ඉදිකරන ලද්දේ කවදාද?

*මෙම ගොඩනැගිල්ලටපසුව සිදුකළ නව හැඩගැන්වීම් , අලුතින් එකතු කිරීම්, හෝ වෙනස් කිරීම්, නොව එහි ඉදිකිරීම් නිමකළ වර්ෂය ලකුණු කරන්න.  වර්ෂය නොදන්නේ නම් ආසන්නතම වර්ෂය දක්වන්න.*

- ❍ 1920 ට පෙර
- ❍ 1921-1945
- ❍ 1946-1960
- ❍ 1961-1970
- ❍ 1971-1980
- ❍ 1981-1985
- ❍ 1986-1990
- ❍ 1991-1995
- ❍ 1996-2000
- ❍ 2001-2006

---

**H5.** මෙම වාසස්ථානයට යම් අලුත්වැඩියාවක් අවශ්‍ය වන්නේ ද **?**

*අභිමත නව හැඩගැන්වීම් හෝ අළුතින් එකතු කිරීම්, ඇතුළත් නොකරන්න.*

- ❍ නැත. සාමාන්‍ය නඩත්තුව (පින්තාරු කිරීම, උදුන පිරිසිදු කිරීම ආදිය) පමණක් අවශ්‍ය වේ.
- ❍ ඔව්, සුළු අළුත්වැඩියා (ගැලවීගිය හෝ ලිහිල් වූ ගෙබිම ටයිල්ස්, ගඩොල්, හෝ සෙවිලි තහඩු සදොස් පියගැට, අත්වැට හෝ අංග ආදිය) පමණක් අවශ්‍යය වේ.
- ❍ ඔව්, ප්‍රධාන අළුත්වැඩියා (සදොස් ජලනල හෝ විදුලි කම්බි, බිත්තිවලට, ගෙබිමට හෝ  සිවිලිමට කළයුතු ව්‍යුහාත්මක අලුත්වැඩයා ආදිය) අවශ්‍ය වේ.

---

එක වාසස්ථානයකට වඩා වැඩි ගණනක් ඔබ සතු හෝ ඔබ කුලියට ගෙන ඇති වුවද **H6** සිට **H8** දක්වා ප්‍රශ්න සම්බන්ධයෙන් එබඳැනට පදිංචි නිවසට අදාලව පමණක් පිළිතුරු සපයන්න. නිවැරදි සංඛ්‍යාව නොදන්නේ නම් කරුණාකර ආසන්නතම සංඛ්‍යාව දක්වන්න.

සටහන: *ඔබ හෝ මෙම වාසස්ථානයේ සිටින අන්කවරකු හෝ, ඔබ හෝ ඔවුන් විසින් මෙහෙයවනු ලබන ගොවි පලක පදිංචි ගොවිපල ක්‍රියාකරුවකු නම්, මෙහි ➜ ❍ ලකුණු කර ඉදිරිපිටේ 'උ' පියවරට යොමුවන්න.*

**H6.** මෙම වාසස්ථානය වෙනුවෙන් වාර්ෂිකව (පසුගිය 12 මාසය) ගෙවන ගාස්තු මොනවාද?

(අ) විදුලිය ?

❍ කිසිවක් නැත.
❍ ගෙවල් කුලියේ හෝ වෙනත් ගෙවීම්වල අන්තර්ගත කර ඇත.

හෝ $ _______ _________ .00 වර්ෂයකට

(ආ) තෙල්, ගෑස්, ගල් අඟුරු, දර හෝ අනෙකුත් ඉන්ධන ?

❍ කිසිවක් නැත.
❍ ගෙවල් කුලියේ හෝ වෙනත් ගෙවීම්වල අන්තර්ගත කර ඇත.

හෝ $ _______ _________ .00 වර්ෂයකට

(ඇ) ජලය සහ අනෙකුත් නගර සභා සේවාවන් ?

❍ කිසිවක් නැත.
❍ ගෙවල් කුලියේ හෝ වෙනත් ගෙවීම්වල අන්තර්ගත කර ඇත.

හෝ $ _______ _________ .00 වර්ෂයකට

---

**H7.** ගෙවල් කුලී කරුවන්ට පමණි**:**

මෙම වාසස්ථානයට ගෙවන මාසික කුලිය කීයද?

❍ මුදලින් කුලී ගෙවීමකින් තොරව කුලියට ලබාගෙන ඇත.

හෝ $ _______ _________ .00 මාසයකට

---

**H8.** අයිතිකරුවන් සඳහා පමණී. (අ) කොටසේ සිට (ඊ) කොටස දක්වා පිළිතුරු සපයන්න **:**

(අ) මෙම වාසස්ථානය සඳහා සාමාන්‍ය මාසික උකස් හෝ ණය වාරික ගෙවීම්වල මුළු මුදල කොපමණද ?

❍ කිසිවක් නැත. ➔ (ඇ) කොටසට යොමුවන්න.

හෝ $ ________ __________ .00 මසකට

(ආ) (අ) කොටසේ දැක්වූ මුදලෙහි දේපල බදු (නගර සභා සහ පාසල්) ඇතුළත් කර තිබේද ?

❍ ඔව් ➔ (ඇ) කොටසට යොමුවන්න.
❍ නැත

(ඇ) මෙම වාසස්ථානය සඳහා තක්සේරුගත වාර්ෂික දේපල බදු (නගර සභා සහ පාසල්) ප්‍රමාණය කොපමණ ද?

❍ නැත

හෝ $ ________ __________ .00 වර්ෂයකට

(ඈ) ඔබ මේ මොහොතේ මෙම වාසස්ථානය විකුණන්නේ නම්, ඔබ එය විකිණීමට අපේක්ෂිත මුදල කොපමණ ද?

**$** ______ __________ _________ .00

(ඉ) මෙම වාසස්ථානය ලියාපදිංචි සහාධිපත්‍ය (condominium) දේපලක කොටසක් ද?

❍ ඔව් ➔ (ඊ) කොටසට යොමුවන්න.
❍ නැත ➔ ඉදිරි පිටේ 'උ'– පියවරට යොමුවන්න.

(ඊ) මාසික සහාධිපත්‍ය (condominium) ගාස්තුව කොපමණ ද ?

❍ නැත

හෝ $ ________ __________ .00 මසකට

---

## උ පියවර

ඔබ, ඔබගේ ප්‍රශ්නාවලිය දැන් සම්පූර්ණ කර තිබේ.

---

# 2 වන කොටස

## මෙම ප්‍රශ්න නැගීමට තුඩුදුන් හේතු

# මෙම ප්‍රශ්න නැඟීමට තුඩුදුන් හේතු

## අ' පියවර

ඔබගේ ප්‍රශ්නාවලියේ යම් තොරතුරු ලබාදීම ඔබට අමතක වුවහොත් පමණක් ඔබව ඇමතීම සඳහා අපට ඔබගේ දුරකථන අංකය අවශ්‍ය වේ.

සියලුම වාසස්ථාන ගණන්ගනු ලැබූ බව තහවුරු කර ගැනීමට ඔබගේ ලිපිනය අපට අවශ්‍ය වේ. මුද්‍රිත ලිපිනයක් ප්‍රශ්නාවලියේ පිටකවරයේ සපයා නැති නම් හෝ ඉදිරි පිටකවරයේ මුද්‍රිත ලිපිනය, ඔබ **2006** මැයි **16** වන දින වාසය කළ ලිපිනයෙන් වෙනස් වේ නම් හෝ පමණක් ඔබගේ ලිපිනය සඳහන් කරන්න.

මුද්‍රිත ලිපිනය නිවැරදි නොවන (වීථි නාමයේ යතුරුලියන දෝෂයක් හෝ වීථි වර්ගයේ වරදක් වෙත් නම්) විටෙක ඔබගේ ලිපිනය අදාළ පිළිතුරු කොටුවේ හෝ මද්‍රිත ලිපිනය ලියූ කොටුවෙහි, ඔබ විසින් නිවැරදි කිරීමට අවශ්‍ය නොවේ.

ඔබගේ දුරකථන අංකය සහ ඔබගේ ලිපිනය පශ්චාත් සංගණන සමීක්ෂණවලදී යොදාගනු ලැබිය හැකිය.

## ආ සහ ඇ පියවර

ඔබගේ ප්‍රශ්නාවලියෙහි ඇතුළත් කළ යුත්තේ කවුරුන්ද ඇතුළත් නොකළ යුත්තේ කවුරුන්ද යන වග තීරණය කිරීමට ඔබට මෙම පියවරයන් ඉවහල්වේ. අපට ගණන් ගැනීමට අවශ්‍ය සෑම දෙනාවම අපි ගණන් ගෙන ඇති බවත් කිසිදු තැනැත්තකු දෙවරක් ගණන් ගෙන නොමැති බවත් තහවුරු කර ගැනීමට, අපට ඒවා උපකාරී වේ. ඔබගේ ප්‍රශ්නාවලියේ දෙවන පිටුවේ 1, 2, හා **3** වන උපදෙස්වලට කරුණාකර යොමුවන්න.

## ඇ - පියවර

ඔබගේ පවුලේ යම් කිසිවෙක් ගොවිපලක් මෙහෙය වනවාද යන්න මෙම පියවර අපට කියා දේ. එසේම කෘෂි සංගණනය සඳහා සෑම ගොවිපලක්ම අපි ගණනය කළ බව ද එමගින් තහවුරු වේ.

## ඉ- පියවර

4 වන පිටුවේ ඉහළින් වූ ප්‍රශ්න අංක 1 ට පිළිතුරු වශයෙන් කරුණාකර ආ- පියවරේදී ඔබ විසින් ලැයිස්තුගත කළ නම් පැහැදිලි අකුරෙන් සපයා ඇති කොටු තුළ එම පිළිවෙලින්ම නැවතත් පිටපත් කරන්න. ඔබගේ පවුලේ සාමාජිකයන් සඳහා සැපයූ දත්ත, ඔබ විසින් හඳුනාගත් සියලුම තැනැත්තන්ගේ නම් වලට අනුරූපීවීම වැදගත් වේ. මෙම ප්‍රශ්නාවලිය සැලසුම්කර ඇත්තේ පුද්ගලයන් **5** ක් හෝ ඊට අඩු සාමාජිකයන් සිටින පවුල් සඳහාය. ඔබගේ පවුලේ සාමාජිකයන් **5** කට වඩා සිටීනම් ඔබට දෙවන ප්‍රශ්නාවලියක් අවශ්‍ය වන අතර, 1-877-549 -2006 ගාස්තුවෙන් නිදහස් අංකයෙන් සංගණන සහායක ඇමතුමට කථා කිරීමෙන් ඔබට එම අමතර ප්‍රශ්නාවලිය ලබාගත හැක.

# ප්‍රශ්න

## මූලික ජනගහන තොරතුරු

කිසිදු තැනැත්තකු මගහැරී නොයන පරිදි හෝ කිසිවකු දෙවරක් ගණනය නොකෙරෙන පරිදි 1 වන ප්‍රශ්නයෙන් පවුලේ එක් එක් තැනැත්තාගේ නම් විමසා ඇත.

2 සිට 6 දක්වා වන ප්‍රශ්න වලින් එක් එක් කුටුම්භයක වෙසෙන පුද්ගලයන් පිළිබඳව විමසා ඇත. මෙම ප්‍රශ්න මගින්, කැනඩාවේ ජීවතවන ජනතාවගේ වාසස්ථාන වැඩ පිළිවෙල, පවුල්වල ප්‍රමාණය, දෙමාපියන්ගෙන් එක් අයකු සමග හෝ දෙමාපියන් සමග ජීවත්වන දරුවන් සංඛ්‍යාව, සහ තනිව ජීවත්වන පුද්ගලයන් සංඛ්‍යාව පිළිබඳව අපට ඉගෙනගත හැකිය. මෙම තොරතුරු, වැඩිහිටි ආරක්ෂාව, සහ ළමා බදු ප්‍රතිලාභ ආදී සමාජීය වැඩ සටහන් සැලසුම් කිරීම සඳහා යොදාගනු ලැබේ. එම තොරතුරු දිවාසුරැකුම් මධ්‍යස්ථාන, පාසල් හා ජ්‍යෙෂ්ඨ පුරවැසි නිවාස ආදී විවිධ සේවාවන් සැලසුම් කිරීමට නගර හා උපනගර විසින් ද යොදා ගනී.

## දෛනික ජීවිතයේ ක්‍රියාකාරකම්

දෛනික කටයුතු වලදී දුෂ්කරතාවලට මුහුණදී සිටින සහ ශාරීරික තත්ත්වයක්, මානසික තත්ත්වයක්, හෝ සෞඛ්‍ය ගැටළුවක් හේතුවෙන් කටයුතු සීමාවී ඇති තැනැත්තන් සංඛ්‍යාව පිළිබඳ තොරතුරු 7 වන හා 8 වන ප්‍රශ්න මගින් ලබාදේ. මෙම තැනැත්තන් ස්වකීය දෛනික ජීවිතයේ දී මුහුණ දෙන අවහිරතාවන් පිළිබඳව වැඩිදුර තොරතුරු සොයා ගැනීමට කැනඩා සංඛ්‍යාලේඛන ආයතනය විසින් මෙම ප්‍රතිඵල භාවිත කරනු ලැබේ.

## සමාජ සංස්කෘතික තොරතුරු

ප්‍රශ්න අංක 9 සිට 21 දක්වා වන ප්‍රශ්න මගින් කැනඩා ජනගහනයේ සමාජ සංස්කෘතික පැතිකඩ හෙළි කරයි.

අදාල තැනැත්තා උපත ලැබූ කැනඩාවේ පළාත හෝ ප්‍රාන්තය හෝ කැනඩාවෙන් බාහිර රට කුමක්දැයි 9 වන ප්‍රශ්නය විමසයි. කැනඩාව ඇතුළත හා කැනඩාව සහ අනෙකුත් රටවල් අතර ජනගහන සංචලනය පිළිබඳව මෙම තොරතුරු අපට කියා දේ. එසේම කැනඩා ජනගහනයේ විවිධත්වය පිළිබඳ තොරතුරු ද එමගින් ලබාදේ.

කැනඩා ජනගහනයේ පුරවැසි තත්ත්වය පිළිබඳව අපට කියා දෙන්නේ 10 වන ප්‍රශ්නයයි. මැතිවරණ සැලසුම් කරණයේදී මෙම තොරතුරු උපකාරීවන අතර එම තොරතුරු වයස් පිළිබඳ දත්ත සමග මුසු කිරීමෙන් ඡන්දය ප්‍රකාශ කළ හැකි තැනැත්තන්ගේ සංඛ්‍යාව ගණනය කළ හැක. පුරවැසි පන්ති සහ වැඩ සටහන් සැලසුම් කිරීමට යොදා ගන්නා තොරතුරු ද මෙම ප්‍රශ්නයෙන් ලබා දේ.

කැනඩාවේ සිටින සංක්‍රමණිකයන් සහ ස්ථිර පදිංචිකරුවන් නොවන තැනැත්තන් සංඛ්‍යාව සහ එම තැනැත්තන් කැනඩාවට සංක්‍රමණය වූ අවුරුද්ද 11 වන හා 12 වන ප්‍රශ්න අපට කියා දේ. කාලය ඉක්මවා රැඳී සිටින සංක්‍රමණිකයන්ගේ සමාජ – ආර්ථික තත්ත්වයන් සැසඳීමට හා සංක්‍රමණික හා රැකියා ප්‍රතිපත්ති හා වැඩ සටහන් සමාලෝචනය කිරීමට මෙන්ම අධ්‍යාපන, සෞඛ්‍ය හා වෙනත් සේවාවන් සැලසුම් කිරීමට ද මෙම ප්‍රශ්නයෙන් ලබාගන්නා තොරතුරු යොදාගනු ලැබේ.

අයිතිවාසිකම් සහ විමුක්තීන් පිළිබඳ කැනේඩියානු ප්‍රඥප්තිය යටතේ කැනේඩියානුවන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කරන වැඩ සටහන් ක්‍රියාත්මක කිරීමට 13 සිට 16 දක්වා ප්‍රශ්නවල තොරතුරු යොදා ගැනේ. භාෂා පුහුණු සහ ඉංග්‍රීසි හා ප්‍රංශ වලින් භාෂාවෙන් සැපයෙන සේවාවන් වල අවශ්‍යතාව තීරණය කිරීමට ද මෙම තොරතුරු ඉවහල් වේ.

17 වන ප්‍රශ්නයෙන් කැනඩා ජනගහනයේ ජනවාර්ගික හා සංස්කෘතික විවිධත්වය පිළිබඳ තොරතුරු සපයා දේ. බහුසංස්කෘතිවාදී පනත අයිතිවාසිකම් හා විමුක්ති පිළිබඳ කැනේඩියානු ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍යවන තොරතුරු රැස්කිරීමට මෙම ප්‍රශ්නයෙන් අවකාශ සැලසේ. ජනවාර්ගික හා සංස්කෘතික සංගම් මෙන්ම නියෝජිතායතන සහ පර්යේෂකයන් විසින් ද මෙම තොරතුරු සෞඛ්‍ය ප්‍රවර්ධන, සන්නිවේදන හා අලෙවිකරණ ආදී කටයුතුවලදී පුළුල්ලෙස යොදාගනු ලැබේ.

18, 20 හා 21 වන ප්‍රශ්නවලින් ආදිවාසී ජනතාවන් (උතුරු ඇමරිකානු ඉන්දියානුවන්, මෙටිස්, ඉනුඉට්) පිළිබඳ තොරතුරු ලබාදෙන අතර ඒවා ව්‍යවස්ථා සහ ඉන්දියානු පනත හා රැකියා සාධාරණත්ව පනත යටතේ රැකියා වැඩ සටහන් පරිපාලනය සඳහා යොදාගනු ලැබේ. මෙම තොරතුරු පර්යේෂකයන් සහ ආදිවාසී ජනතාවන්ගේ රජයන් විසින් අනේකවිධ ජනවිකාශ හා සමාජ- ආර්ථික ගැටළු රැසක් පිළිබඳව ගවේෂණය කිරීම සඳහා ප්‍රයෝජනයට යොදා ගැනේ.

ප්‍රශ්න අංක 19, කැනඩාවේ ජනගහනයේ දෘෂ්‍ය සුළු ජාතිය නිර්මාණය වී ඇති ජන කණ්ඩායම් පිළිබඳව අපට කියාදේ. සැමදෙනාටම සම අවස්ථා සැලසීම ප්‍රවර්ධනය කරන රැකියා සාධාරණත්ව පනත යටතේ ක්‍රියාත්මක කෙරෙන වැඩ සටහන් සඳහා මෙම තොරතුරු අවශ්‍ය වේ.

## සචලතාව

කැනඩාවේ ජීවත්වන ජනතාව කොහිසිට කොතැනකට කැනඩාව ඇතුළත හෝ ඉන් පිටතට විතැන් වන්නේ ද යන්න පිළිබඳ තොරතුරු 23 හා 24 වන ප්‍රශ්න වලින් අපට කියාදේ. මෙම තොරතුරු, සංගණන අතරතුර ජාතික, පළාත් හා ප්‍රාදේශීය මට්ටම්වල ජනගහනය තකසේරු කිරීමට ඉවහල් කරගනී. තවද මෙම තොරතුරු, නිවාස, අධ්‍යාපනය, ගමනාගමනය හා සමාජ සේවා ආදිය සඳහා අනාගත අවශ්‍යතා හඳුනාගැනීමටත් රාජ්‍ය මූල්‍ය විධිවිධාන පනත යටතේ ක්‍රියාත්මක වන වැඩ සටහන් සඳහා දායක වීමටත් එකසේ යොදා ගැනේ.

## දෙමාපියන් උපන් ස්ථානය

කැනඩාවෙන් පිටත තම දෙමාපියන් ඉපිද ඇති නමුත් තමන් කැනඩාවේ උපන් ජනතාවගේ සංඛ්‍යාව අපට 25 වන ප්‍රශ්නය කියා දෙයි. මෙම ප්‍රශ්නයෙන් ලබාදෙන තොරතුරු දෙවන පරම්පරාවෙන් කැනේඩියානු ජාතිකයන්ගේ සමාජ – ආර්ථික තත්ත්වය තක්සේරු කිරීමට යොදා ගත හැක.

## අධ්‍යාපනය

ප්‍රශ්න අංක 26 සිට 32 දක්වා ප්‍රශ්න කැනඩාවේ වෙසෙන ජනතාවගේ අධ්‍යාපනය හා පුහුණුව සහ ඔවුන්ගේ විශේෂිත රැකියා කුශලතා පිළිබඳව අපට කියා දේ. ශ්‍රම බලකායේ විශේෂිත අංශයක නියමිත අධ්‍යාපනය, පුහුණුව සහ රැකියා කුශලතා සහිත තැනැත්තන් ප්‍රමාණවත් පිරිසක් සිටී ද යන වග තක්සේරු කිරීමට මෙම තොරතුරු රජයන් හා සේවා යෝජකයන් විසින් යොදා ගැනේ. එවිට අපගේ ශ්‍රම බලකායේ වෙනස්වන අවශ්‍යතා සපුරාගැනීම සඳහා පුහුණු වැඩ සටහන් සංවර්ධනය කිරීමට ඔවුනට හැකිවනු ඇත.

පැසල් අධ්‍යාපනය පිළිබඳව 32 වන ප්‍රශ්නයෙන් ලබාදෙන තොරතුරු කැනඩා ශිෂ්‍ය ණය පනත යටතේ, ක්‍රියාත්මක කරන වැඩිහිටි අධ්‍යාපන වැඩ සටහන් සහ පශ්චාත් ද්විතීය අධ්‍යාපනය සැලසුම් කිරීම සහ මූල්‍ය සම්පාදනය කිරීම සඳහා අවශ්‍ය වේ. පාසලේ රැඳී සිටීමට හෝ පාසලට ආපසු යැමට ජනතාවට උපකාර කෙරෙන දිරිදීමනා සහ වැඩ සටහන් සංවර්ධනය කිරීමට ද මෙම තොරතුරු යොදාගනු ලැබේ.

## ගෘහස්ථ ක්‍රියාකාරකම්

වැටුප් නොගෙවන ගෘහස්ථ ක්‍රියාකාරකම් සඳහා ජනතාව කොපමණ කාලයක් වැය කරනවාද යන්න පිළිබඳව තොරතුරු **33** වනප්‍රශ්නයෙන් ලබාදේ. මෙම තොරතුරු වැටුප් ලබන වැඩ පිළිබඳ දත්ත සමග එක්කළ විට කැනඩාවේ වෙසෙන ජනතාව ස්වකීය වැටුප් ලබන හා වැටුප් නොලබන ක්‍රියාකාරකම් අතර තුලනයක් පවත්වාගනු ලබන්නේ කෙසේද යනවග පිළිබඳ පැහැදිලි චිත්‍රයක් ලබාදේ.

## ශ්‍රම වෙළඳපොළ කටයුතු

වයස අවුරුදු **15** සහ ඊට වැඩි තැනැත්තන් විසින් ඉටු කරනු ලබන වැටුප් ලබන සහ ස්වයං - රැකියා වැඩ කටයුතු පිළිබඳ තොරතුරු ප්‍රශ්න අංක **34** සිට **50** දක්වාවූ ප්‍රශ්න මගින් සැපයේ. මෙම තොරතුරු අධ්‍යාපන හා පුහුණු වැඩ සටහන් සැලසුම් කිරීම, භාෂා භාවිතය ඇගැයීම, අනාගත රැකියා අවස්ථා පුරෝකථනය කිරීම, කාර්යක්ෂම ප්‍රවාහන සහ මගී ප්‍රවාහන ක්‍රම සැලසුම් කිරීම සහ රටපුරා වෙසෙන ප්‍රජාවන් තුළ රැකියා උත්පාදන පියවරයන් සංවර්ධනය කිරීම ආදී කටයුතු වලදී ව්‍යාපාරික ආයතන සහ සියලු මට්ටම්වල රජයන් විසින් යොදාගනු ලැබේ.

## 2005 වර්ෂයේ ආදායම

කැනඩාවේ වෙසෙන සියලුම තැනැත්තන්, ඔවුන්ගේ පවුල් සහ කුටුම්භයන් සඳහා සවිස්තර ආදායම් සංඛ්‍යාලේඛන මූලාශ්‍රයක් ප්‍රශ්න අංක **51** හා **52** මගින් ලබාදේ. ආදායම් බදු ලිපිගොනු මගින් සියලුම තැනැත්තන් ආවරණය නොකෙරෙන අතරම අදාළ ආදායම සමගින් එම ආදායම් ලබන තැනැත්තන්ගේ චරිත ලක්ෂණ පිළිබඳ සමහර වැදගත් තොරතුරු සපයාදීමක් සිදු නොවේ.

රජයන් විසින් මෙම තොරතුරු, වැඩිහිටි ආරක්ෂණ විශ්‍රාම වැටුප්, පළාත් ආදායම් පරිපූරක, හා සමාජ සහන ගෙවීම් ආදී ආදායම් ආධාරක වැඩ සටහන් සංවර්ධනය කිරීම සඳහා යොදාගනු ලැබේ. පවුලේ ආදායමට අතිරේක ආදායම් සලස්වන අනෙකුත් වැඩ සටහන් කාර්යක්ෂමභාවයෙන් යුතුව එම කාර්යය ඉටු කරන බව තක්සේරු කිරීමට ද ආදායම් සංඛ්‍යාලේඛන උපකාරී වේ. සාධාරණ වැටුප් හා නිවාස වැඩ සටහන් ආදී අනෙකුත් වැඩ සටහන් තක්සේරු කිරීමට ද සහන අවශ්‍ය වන රටේ නොයෙකුත් ප්‍රදේශ හඳුනා ගැනීමට ද ඒවා ඉවහල් වේ.

යෝග්‍ය පාරිභෝගික කණ්ඩායම්වලට ආසන්නයේ සිල්ලර හා තොග අලෙවි මධ්‍යස්ථාන ස්ථානගත කිරීමටත් තම නිෂ්පාදන හා සේවාවන් සඳහා මිලදීගැනීමේ හැකියාවෙන් හෙබි වෙළඳපොළවල් තීරණය කර ගැනීමටත් ව්‍යාපාරිකයෝ මෙම ආදායම් සංඛ්‍යාලේඛන යොදාගනිති.

කම්කරු සංගම් හා ව්‍යාපාරිකයන් විසින් වේතන පටිපාටි පිළිබඳව රැකියාලාභී කණ්ඩායම් සමග සාකච්ඡා කිරීමටත් හිමිකම් වන්දි ඉල්ලීම් බේරුම් කිරීමටත් මෙම ආදායම් සංඛ්‍යාලේඛන යොදාගනු ලැබේ.

සමාජ සහන අවශ්‍ය කෙරෙන කැනේඩියානුවන් නියෝජනය කරන සංවිධාන ද මෙම සංගණනයේ ආදායම් සංඛ්‍යා ලේඛණ මත බොහෝ විට ස්වකීය කරුණු දැක්වීම් පදනම් කරගනී.

තනි පුද්ගලයන්ට ද මෙම ආදායම් සංඛ්‍යාලේඛන තම ආදායම තම රැකියාවේ සාමාන්‍ය ආදායම සමග, තම ප්‍රදේශයේ හෝ සමස්තයක් වශයෙන් ජාතික ආදායම් සමග සසඳා බැලිය හැකිය.

පෞද්ගලික හෝ අනන්‍යතාවය තහවුරු කරගත හැකි වන තොරතුරු, කිසිදා විටෙක විකිණීම හෝ තැපැල් ලැයිස්තුවලට ලබාදීම හෝ සිදු නොකෙරේ. මෙම සංගණනයේදී රැස්කරනු ලබන ආදායම් හෝ වෙනත් පෞද්ගලික තොරතුරු වලට ප්‍රවේශ වීමට කැනඩා ආදායම් නියෝජිතායතනය (**CRA**) ආදී අනෙකුත් රජයේ දෙපාර්තමේන්තු ඇතුළුව කවර හෝ තැනැත්තකුට නොහැකි වේ. ඔබගේ සියලු පිළිතුරු රහසිගතව තබාගනු ඇත. එය නීතියයි.

## සංගනයෙන් වසර 92 ක් ඉකුත්වූ පසුව පෞද්ගලික තොරතුරුවලට ප්‍රවේශය

ස්වකීය පෞද්ගලික සංගණන තොරතුරුවලට සිදුවන්නේ කුමක්ද යන්න පිළිබඳව දැනුවත් තීරණයක් ගැනීමට අවස්ථාවක් සෑම තැනැත්තකුට හිමිවන බව **53** වන ප්‍රශ්නයෙන් පිළිතුරු සපයන්නා මෙම ප්‍රශ්නයට 'ඔව් ' යනුවෙන් පිළිතුරු දුනහොත් පමණක් ඔවුන්ගේ **2006** සංගණන තොරතුරු අවුරුදු **92** කට පසුව මුදාහරිනු ලැබේ. මෙම සංගණන තොරතුරු මුදාහැරීමට අනුමතිය පළ කිරීමෙන් **2006** දී කැනඩාවේ සමාජය පිළිබඳව මනා අවබෝධයක් ලබාගැනීමට අනාගත පරම්පරාවන්ට අවකාශ සැලසේ.

මෙම ප්‍රශ්නයට පිළිතුරු සැපයීමේදී කරුණාකර පවුල් ඒකකයේ එක් එක් තැනැත්තා සමග සාකච්ඡා කර ඔවුන්ගේ අදහස් ලබාගෙන මෙයට පිළිතුරු සපයන්න. යම් තැනැත්තකුගේ අදහස් නොදන්නේ නම් එම තැනැත්තා සම්බන්ධයෙන් මෙම ප්‍රශ්නයට පිළිතුරු නොදී හිස්ව තබන්න. ළමයින් වෙනුවෙන් දෙමාපියන් හෝ නෛතික භාරකරු විසින් පිළිතුරු සැපයිය යුතුය.

යම් තැනැත්තකු තම පිළිතුර වෙනස් කිරීමට හෝ පිළිතුරු නොදී තිබූ ප්‍රශ්නයට පිළිතුරු දීමට කැමැත්තේ නම්, කරුණාකර සම්බන්ධීකාරක, තොරතුරු සඳහා ප්‍රවේශය සහ රහස්‍යභාවය කැනඩා සංඛ්‍යා ලේඛන ආයතනය (Coordinator, Access to Information and Privacy, Statistics Canada), 120 Parkdale Ave, Ottawa, ON, K1A 0T6

ඊ පියවර – නිවාස

ප්‍රශ්න අංක **H1** සිට **H8** දක්වා වූ ප්‍රශ්න, රජයේ ප්‍රතිපත්ති සම්පාදකයන්ට සහ පෞද්ගලික සංවර්ධකයන්ට නිවාස ප්‍රජාවන් හා ව්‍යාපෘති සංවර්ධනය කිරීමට අවශ්‍ය තොරතුරු සපයා දේ. ජාතික නිවාස පනත හා කැනඩා උකස් හා නිවාස සංස්ථා පනත යටතේ ක්‍රියාත්මක කරනු ලබන වැඩ සටහන් බොහෝමයක් සඳහා මෙම තොරතුරු දායකවේ.

නිවාසවල ඇති කාමර හා නිදන කාමර සංඛ්‍යාව, සහ නිවාස පිරිවැය පිළිබඳ තොරතුරු, විවිධ පළාත්වල වෙසෙන පවුල්වල ආර්ථික තත්ත්වය තක්සේරු කිරීම පිණිස නිවසක වෙසෙන පුද්ගලයන් සංඛ්‍යාව පිළිබඳ දත්ත සමග ඒකාබද්ධ කෙරේ. පළාත් සහ නාගරික රජයන් විසින් මෙම තොරතුරු නිවාස වල ජනගහන මට්ටම මැන ගැනීමට, මෙන්ම යෝග්‍ය නිවාස වැඩ සටහන් සංවර්ධනය කිරීමට ද යොදාගනු ලැබේ.

වාසස්ථානවල වයස සහ ඒවායේ අලුත්වැඩියා අවශ්‍යතා පිළිබඳ තොරතුරු නගර සභා විසින් වටපිටාව වැඩි දියුණු කිරීමේ වැඩ සටහන් සංවර්ධනය කිරීමට යොදාගනු ලැබේ.